# වාර්ෂික වාර්තාව

# 2017

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2019-03-18

ගරු මලික් සමරවික්‍රම
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය,
30 වෙනි මහළ, බටහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01.

ගරු ඇමතිතුමනි,

**<u>වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය - 2017</u>**

1971 අංක 38 දරණ මුදල් පනතේ 13(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2017 වසර සඳහා වන වාර්ෂික වාර්තාව සහ පහත සඳහන් ලියකියවිලි ඔබ වෙත සතුටින් පිළිගන්වමි.

- **සභාපතිනියගේ වාර්තාව**
- **ගිණුම් ප්‍රකාශය**
- **විගණකාධිපතිගේ වාර්තාව**

මෙයටට- විශ්වාසී

ඉන්දිරා මල්වත්ත
සභාපතිනිය සහ ප්‍රධාන විධායක

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

## ජොෂ්ය කළමණාකරණ කාර්ය මණ්ඩලය - 2017

| | | |
|---|---|---|
| සභාපතිනිය සහ ප්‍රධාන විධායක | - | ඉන්දිරා මල්වත්ත මිය |
| අධ්‍යක්ෂ ජනරාල් | – | ජේ. සිරිවර්ධන මිය |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - මුදල් හා පාලන අංශය | – | ආර්. එම් . පි. හේවාලියනගේ මෙය (2017 මාර්තු දක්වා)<br>පි. කේ. සුමිත්‍රාරච්චි මිය (03.04.2017 සිට) |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංවර්ධන අංශය | – | ඩී . ජයවර්ධන මහතා<br>සංවර්ධන අංශය (03.04.2017 සිට) |
| මුදල් අංශය | – | පි. කේ. සුමිත්‍රාරච්චි මිය<br>අධ්‍යක්ෂිකා (02.04.2017 දක්වා)<br>ජී. එම්. හේරත් මෙය<br>අධ්‍යක්ෂිකා (16.10.2017 සිට) |
| මානව සම්පත් කළමණාකරණ අංශය | – | කේ. කේ. ආර්. කන්නංගර මහතා<br>අධ්‍යක්ෂ |
| වෙළඳ පහසුකම් හා වෙළඳ තොරතුරු අංශය | – | එස්. ආර්. පි. ඉන්ද්‍රකීර්ති මහතා<br>අධ්‍යක්ෂ |
| තොරතුරු තාක්ෂණ අංශය | – | අයි. සි. අලහප්පෙරුම මිය<br>අධ්‍යක්ෂිකා |
| කෘෂි අපනයන අංශය | – | පි. වි. ඒ. එම්. බද්දේගමගේ මිය<br>අධ්‍යක්ෂිකා |
| සුළු හා මධ්‍යම ව්‍යවසාය සංවර්ධන අංශය | – | ටී.ඩී. අතපත්තු මහතා<br>අධ්‍යක්ෂ ( 31.03.2017 දක්වා)<br>කේ.එම්.ආර්.පී.ප්‍රනාන්දු මයා<br>වැ.බ. අධ්‍යක්ෂ (01.06.2017 සිට) |
| ප්‍රතිපත්ති හා සැලසුම් අංශය | – | යු.කේ.ඩි. වැගපිටිය මිය<br>අධ්‍යක්ෂිකා |
| කාර්මික නිෂ්පාදන අංශය | – | සි. දිසානායක මෙය<br>අධ්‍යක්ෂිකා |

| | | |
|---|---|---|
| අපනයන සේවා අංශය | – | එම්.කේ. එස්. කේ. මල්දෙනි මහතා<br>අධ්‍යක්ෂ |
| අලෙවි සංවර්ධන අංශය | – | කේ. ඒ. වී. ප්‍රේමතිලක මිය<br>අධ්‍යක්ෂිකා |
| අභ්‍යන්තර විගණන අංශය | – | නිල්මිණි රණසිංහ මිය<br>අභ්‍යන්තර විගණක |
| නීති අංශය | – | ඩී.ටී. විජයරත්න මිය<br>නීති නිළධාරිනී |
| විගණකවරු | – | විගණකාධිපති |
| බැංකු කරුවන් | – | ලංකා බැංකුව<br>සම්පත් බැංකුව<br>ජාතික සංවර්ධන බැංකුව |

<u>ලියාපදිංචි කාර්යාලය</u>
අංක 42 ,නවම් මාවත
කොළඹ 02.

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් - 2017

| | | | |
|---|---|---|---|
| 01. | ඉන්දිරා මල්වත්ත මිය | - | සභාපතිනිය |
| 02. | බන්දුල එගොඩගේ මහතා | - | අධ්‍යක්ෂ |
| 03. | සනත් ඩි සිල්වා මහතා | - | අධ්‍යක්ෂ |
| 04. | එම්.ජේ.එෆ්. කසීම් මහතා | - | අධ්‍යක්ෂ |
| 05. | රොහාන් අබේකෝන් මහතා | - | අධ්‍යක්ෂ |
| 06. | එස්. එම්. එම්. සලහුදීන් මහතා | - | අධ්‍යක්ෂ |
| 07. | ආචාර්ය යූසුෆ් කේ. මරික්කාර් මහතා | - | අධ්‍යක්ෂ |
| 08. | එල්.පි. ජයම්පති මහතා | - | ලේකම්<br>වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය |
| 09. | ඩබ්.එම්.එම්.ආර්. අධිකාරි මිය | - | ලේකම්<br>ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය අමාත්‍යාංශය<br>(2017 නොවැම්බර් දක්වා) |
| 10. | එම්.අයි.එම්. රෆීක් මහතා | - | ලේකම්<br>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br>(2017 ජුලි දක්වා) |
| 11. | යූ. ජී. රත්නසිරි මහතා | - | අතිරේක ලේකම් (ආර්ථික කටයුතු)<br>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br>(2017 නොවැම්බර් දක්වා) |
| 12. | ඩි.වි. බන්දුලසේන මහතා | - | ලේකම්<br>කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 13. | ජී. ආසිරිවතම් මිය | - | රාජ්‍ය ලේකම් (ආර්ථික කටයුතු)<br>විදේශ කටයුතු අමාත්‍යාංශය<br>(2017 නොවැම්බර් දක්වා) |
| 14. | යූ.කේ.එස්. මිහිඳුකුලසූරිය මහතා | - | අතිරේක ලේකම්<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය<br>(2017 පෙබරවාරි දක්වා) |
| 15. | අංජලී දේවරාජා මෙය | - | අතිරේක ලේකම්<br>ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය<br>(2017 මාර්තු දක්වා) |

| | | | |
|---|---|---|---|
| 16. | බන්දුල වික්‍රමාරච්චි මහතා | - | ලේකම්<br>ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය<br>(2017 සැප්තැම්බර් සිට) |
| 17. | ඩබ්. ඒ. ඩී. එස්. ගුණසිංහ | - | අතිරේක ලේකම්<br>සංවර්ධන උපායමාර්ග හා විදේශ වෙළඳ අමාත්‍යාංශය<br>(2017 මැයි සිට) |
| 18. | එස්. සේනානායක මහතා | - | අතිරේක ලේකම් (සැලසුම් හා සංවර්ධන)<br>ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| 19. | ෂෙයිතා සේනාරත්න මිය | - | අතිරේක ලේකම්<br>කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය |
| 20. | පි.එච්.ඒ.එස්. විජේරත්න මහතා | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්<br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව<br>මුදල් අමාත්‍යාංශය |

# පටුන


| | | |
|---|---|---|
| 01 | හැඳින්වීම | 8 |
| 02 | 2017 වර්ෂයේ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය | 9-31 |
| 03 | 2017.12.31 දිනට ශේෂ පත්‍රය | 32 |
| 04 | 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය | 33 |
| 05 | හිමිකම් ප්‍රකාශය | 34 |
| 06 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 35 |
| 07 | මූල්‍ය ප්‍රකාශන සටහන් | 36-44 |
| 08 | විගණන වාර්තාව | 45-60 |

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛතම ආයතනය අපනයන සංවර්ධන මණ්ඩලය වේ. එය 1979 අංක 40 දරණ අපනයන සංවර්ධන පනත යටතේ පිහිටුවන ලදී. ජාතික අපනයන ඉලක්ක සපුරා ගැනීමෙහිලා උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීමේදී අපනයන සංවර්ධන මණ්ඩලය ‘‘ප්‍රතිපත්ති උපදේශක, ‘‘අධීක්ෂක‘‘, ‘‘ප්‍රවර්ධක‘‘, ‘‘පහසුකම් සපයන්නා‘‘ සහ ‘‘දැනුම සපයන්නා‘‘, යන භූමිකා ඔස්සේ තම කාර්යභාරය ඉටු කරනු ලැබේ.

## දැක්ම

අපනයන සංවර්ධන මණ්ඩලයේ දැක්ම වන ‘‘නව නිපැයුම් සහ සේවා‘‘ සඳහා ශ්‍රී ලංකාව විශිෂ්ඨ අපනයන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම රජයේ සංවර්ධන ආර්ථික දැක්ම සහ ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්මේ දැක්ම හා මනාව ගැළපේ.

## මෙහෙවර

අපනයන සංවර්ධන මණ්ඩලයේ මෙහෙවර වන නවෝත්පාදනය, ව්‍යවසායකත්වය සහ ගෝලීය ඒකාබද්ධ වීම තුලින් අපනයන තරඟකාරීත්වය මගින් විදේශ විනිමය ඉපැයුම් ඉහල නංවන අතර එමගින් ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් දක්වනු ලැබේ.

## අපනයන සංවර්ධන මණ්ඩලය 2020 සඳහා ප්‍රධාන ප්‍රගති දර්ශක

අ) 2020 වසර වන විට අපනයන ආදායම ඇ.ඩො.බි. 22 දක්වා ඉහළ නැංවීම සහ එමගින් රටේ දළ ජාතික නිෂ්පාදිතයට 20% ක දායකත්වයක් ලබා දීම.


ආ) අධ්‍යාපනය ලත් නිපුණතාවලින් යුතු තරුණ පිරිසට තත්ත්වයෙන් යුතු රැකියා 100,000 ක් නිර්මාණය කිරීම.

ඇ) අපනයන සංවර්ධන මණ්ඩලයේ ස්ථාවර අපනයනකරුවන් 20 කට සහන සලසමින් අපනයන ආදායම ඉහළ නැංවීම.

ඇ) ව්‍යවසායකයින් 200 ක් අපනයන ක්ෂේත්‍රයට එක් කිරිම.

ඉ) ගෝලීය අගය දාමයට සහ ගෝලීය නිෂ්පාදන ජාලයට නව නිෂ්පාදන 4-5 ක් එක් කිරීම.

# ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රගතිය 2017





2017 වසරේ ශ්‍රී ලංකාවේ භාණ්ඩ සහ සේවා අපනයනයන්ගෙන් විදේශ විනිමය උපැයුම් ඇ.ඩො.බි. 12 ක් වූ අතර එය 2016 වසරේ උපයන ලද ඇ.ඩො.බි. 13.7 හා සසඳන විට 10% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2017 වසර භාණ්ඩ අපනයනයෙන් ඇ.ඩො.බි. 11.4 ක් උපයා ගැනීමට හැකි වූ අතර 2016 වසර භාණ්ඩ අපනයන ආදායම ඇ.ඩො.බි 10.3 ක් විය.

ඇස්තමේන්තු ගත සේවා අපනයන එනම් තොරතුරු සන්නිවේදන තාක්ෂණ, ඉදිකිරීම්, මූල්‍ය සේවා සහ කාර්ය උපාය (Logistics) යනාදී මගින් ඇ.ඩො.බි. 3.7 ක් වූ අතර එය පෙර වසර හා සසඳන විට 8.1% ක වර්ධනයක් වාර්තා කරයි.

මෙයට අමතරව 2017 වසරේ මාර්තු (ඇ.ඩො.මි 1,036), ජුනි (ඇ.ඩො.මි. 1,167), සැප්තැම්බර් (ඇ.ඩො.මි. 1,012) සහ දෙසැම්බර් (ඇ.ඩො.මි 1,009) මාසයන් හි භාණ්ඩ අපනයනයෙන් ප්‍රථම වරට ඇ.ඩො.බිලියන 1 ඉක්ම වූ ආදායම් වාර්තා විය.

2018 වසරේ දී අපනයන සංවර්ධන මණ්ඩලය භාණ්ඩ හා සේවා අපනයනයෙන් විදේශ විනිමය ඇ.ඩො.බි. 16.6 ක් උපයා ගැනීමට බලාපොරොත්තු වේ.




| | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2017 | 842.6 | 862.0 | 1035 | 781 | 840.1 | 1166 | 993.6 | 979.7 | 1012 | 959.8 | 926.5 | 1007 |
| 2016 | 865.5 | 889.0 | 932.2 | 689.8 | 759.7 | 884.8 | 991.8 | 854.7 | 887.8 | 834.4 | 794.8 | 834.8 |
| 2015 | 850.3 | 865.0 | 1056 | 694.3 | 872.9 | 922 | 898.9 | 782 | 840.5 | 836.6 | 812.7 | 794 |


2017 වසරේ කෘෂි කාර්මික අපනයනයන් 17.61% වර්ධනය වූ අතර, යුරෝපා සංගමයෙන් ශ්‍රී ලංකාවේ ධීවර නිෂ්පාදන අපනයනයට යෙදූ IUU තහනම ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ධීවර නිෂ්පාදන 40.24% ක සැලකිය යුතු වර්ධනයක් සහ කාර්මික නිෂ්පාදන අපනයනයෙන් 7.6% ක වර්ධනයක් වාර්තා කරන ලදී.


ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්මේ හඳුනාගත් ප්‍රමුඛ නිෂ්පාදන ක්ෂේත්‍රයන් වන විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන අපනයනයෙන් 50% කට අධික වර්ධනයක් 2016 වසර තුල වාර්තා කරන ලදී. කෙසේ වෙතත් ආහාරපාන අපනයනයෙන් 9.14% අඩු වීමක් වාර්තා කරන ලදී.

සමස්ත භාණ්ඩ අපනයනයට 44% ක දායකත්වයක් දක්වන ඇඟලුම් අපනයන ක්ෂේත්‍ර 2017 වසරේ දී 3.06% ක වර්ධනයක් වාර්තා කරන ලදී. යුරෝපා GSP+ සහනය යටතේ ලද 12% බදු සහනය මත යුරෝපා සංගමයෙන් ලැබුණු නව වෙළඳ ඇණවුම් මේ සඳහා විශාල පිටුවහලක් විය. මේ අතරේ 2018 වසර ඇඟලුම් නිෂ්පාදකයන්ට විශේෂ වසරක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සමස්ත අපනයනයට පිළිවෙලින් 13% හා 8% දායකත්වයක් දක්වනු ලබන තේ සහ රබර් අපනයනයන්ගේ 20.78% සහ 8.71% සැලකිය යුතු වර්ධනයක් 2017 වසරේ දක්නට ලැබිණ.

2017 වසරේදී යුරෝපා සංගමයට කළ අපනයන 6.6% කින් 2016 වසර හා සසඳන විට වර්ධනයවී ඇත. 2017 වසරේ දී දකුණු ආසියානු කලාපයට කරන ලද ඇ.ඩො.මි. 226 ක අපනයන, 2016 වසරේදී කරන ලද ඇ.ඩො.මි 609 හා සසඳන විට 25% ක වර්ධනයක් වාර්තා කර ඇත. විශේෂයෙන් ඉන්දියාවට 2017 වසරේදී ඇ.ඩො.මි. 689 ක අපනයනයන් සිදු කළ අතර එය 2016 වසරේදී කළ ඇ.ඩො.මි. 551 ක අපනයනය හා සසඳන විට 25% ක වැඩිවීමකි. මේ අතර එක්සත් රාජධානියේ මුදල් ඒකකයේ අවප්‍රමාණය වීම සහ පාරිභෝගික වෙළඳපල තත්ත්වය යනාදීන් නිසා එක්සත් රාජධානියට සිදු කරන ලද අපනයන්ගේ 0.9% ක අඩුවීමක් 2017 වසරේදී වාර්තා වී තිබිණ.




**ජනාධිපති අපනයන සම්මාන**

21 වන ජනාධිපති අපනයන සම්මාන උළෙල 2017 සැප්තැම්බර් 14 වන දින ගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සහ කැබිනට් හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහභාගීත්වයෙන් බණ්ඩාරණායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වනු ලැබීය. ජනාධිපති අපනයන සම්මාන මගින් රටේ අපනයන කර්තව්‍යයේ දී අපනයනකරුවන් දක්වන සුවිශේෂී දායකත්වය ඇගයීමට ලක් කෙරේ.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, වාණිජ මණ්ඩල නියෝජනය කරමින් ලංකා වාණිජ මණ්ඩලය, ජාතික අපනයනකරුවන්ගේ වාණිජ මණ්ඩලය, ජාතික වාණිජ මණ්ඩලය සහ වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය යන ආයතනයන්ගේ ජ්‍යේෂ්ඨ නිලධාරීන් 7 දෙනෙකුගෙන් සමන්විත සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාම ලත් විනිශ්චයකරුවකුගේ නායකත්වයෙන් සැදුම් ලත් කමිටුවකින් මෙම සම්මානලාභින් තේරීම සිදු කරනු ලැබේ.

මෙහිදී 2016 වසරේ අපනයන ක්ෂේත්‍රයේ උන්නතියට විශේෂ දායකත්වයක් දක්වන ලද අපනයනකරුවන්ට විශේෂිත සමස්ත සම්මාන 11 ක් සහ අංශමය සම්මාන 48 ක් (උපරිම විදේශ විනිමය උපයන්නා සඳහා සම්මාන 14 ක් සහ උපරිම අගය එකතු කරන්නා සඳහා සම්මාන 34 ක්) ඇතුළු සම්මාන 59 ක් ප්‍රදානය කරන ලදී. මෙමගින් රටේ අපනයන සංවර්ධනයෙහි ලා අපනයනකරුවන්ගේ දායකත්වය ජාතික මට්ටමේ පිළිගැනීමක් ලබා දේ. සම්මානලාභින්ට සමරු එලකයක් සමග සහතිකයක් පිරිනමනු ලැබීය. එමෙන්ම ඔවුන්ට එම සම්මානය වසර 3 ක කාලයක් තුළ අලෙවි ප්‍රවර්ධනය කටයුතු සඳහා භාවිතා කල හැක.






සම්මානලාභීන් තෝරා ගැනීමේදී විශාල සහ කුඩා යනාදී සමස්ත අපනයන ව්‍යවසායකයින් සඳහාම අවස්ථාව ලැබෙන පරිදි විවිධ නිර්ණායක පදනම් කරගනු ලැබීය. අපනයන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය විවිධ අංශයන් යටතේ සිදු කරන ලද දායකත්වය පදනම් කරගෙන විශේෂිත සමස්ත සම්මානලාභීන් තෝරා ගැනීම කරන ලදී. එනම් ශුද්ධ විදේශ විනිමය ඉපැයුම් ඉහළ නැංවීම, අපනයන වෙළඳපල. විවිධාංගීකරණය, ශ්‍රී ලාංකීය ලියාපදිංචිය ලත් අපනයන සන්නම් නාම, රැකියා අවස්ථා නිර්මාණය, තිරසාර බවේ විශිෂ්ඨත්වය සහ කලාපීය මට්ටමේ අපනයන ආශ්‍රිත සැපයුම් වැඩි කිරීම සඳහා කාර්මික/ආර්ථික කලාපයන් පිහිටුවීම යනාදී විවිධ අංශ ආවරණය වන පරිදි මෙය සිදු කරන ලදී.

"හොඳම නැගී එන අපනයනකරු සම්මානය" මගින් අපනයන සංවර්ධනය සඳහා සුළු හා මධ්‍ය පරිමාන ව්‍යවසායකයින්ගේ දායකත්වය ඇගයීමට ලක් කරන ලද අතර අපනයන ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය අගයනු වස් "හොඳම කාන්තා අපනයනකරු සම්මානය" පිරිනමන ලදී. මීට අමතරව අපනයන ක්ෂේත්‍රයේ හොඳම ඇසුරුම් සේවා සපයන්නා සඳහා ද සම්මාන පිරිනැමීම සිදු කරන ලදී.

මෙම සම්මාන ප්‍රදානෝත්සවයේදී "ඩිල්මා" සමූහ ව්‍යාපාරයේ සභාපති සහ ආදි කතෘතුමන් විසින් අගය එකතු කළ නිෂ්පාදන සන්නම්කරණයේ වැදගත්කම පිළිබඳ ප්‍රධාන දේශනය සිදු කරන ලදී. අතිගරු ජනාධිපතිතුමා, ගරු සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා සහ ගරු ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා විසින් විදේශීය ධූත මණ්ඩල, රාජ්‍ය නිලධාරීන්, වාණිජ මණ්ඩල නිෂ්පාදන සංගම් සහ පෞද්ගලික සමාගම් නියෝජිතයන්ගෙන් සමන්විත රැස්ව සිටි සමූහයා අමතන ලදී. ගරු ජනාධිපතිතුමා විසින් විශේෂ සම්මාන පිරි නැමීම සිදු කරන ලද අතර ආංශික සම්මාන අදාල විෂය භාර අමාත්‍යවරු විසින් ප්‍රදානය කරන ලදී.

**සමස්ත (විශේෂ) සම්මානලාභීන්**

| | සම්මානය | ජයග්‍රාහකයා |
|---|---|---|
| 1 | හොඳම නැගී එන අපනයනකරු | Wild Lanka Organics |
| 2 | අපනයන සැපයුම් ජාලයට කලාපයන්ගෙන් ඉහළම දායකත්වයක් දක්වන්නා | H J S Condiments Limited |
| 3 | වසරේ හොඳම කාන්තා අපනයනකරු | Trendy Wear (Pvt) Ltd |
| 4 | අපනයන කර්මාන්තයේ වැඩිම රැකියා ප්‍රමාණයක් ලබාදෙන්නා | Brandix Apparel Limited |
| 5 | තිරසාර සංවර්ධනයේ විශිෂ්ඨත්වය | Brandix Apparel Limited |
| 6 | අපනයන ක්ෂේත්‍රයට හොඳම ඇසුරුම් සේවා සපයන්නා | Star Packaging (pvt) Ltd |
| 7 | අපනයනයේ නිරතවන හොඳම බහුජාතික සමාගම | Camso Loadstar (Pvt) Ltd |
| 8 | ඉහළතම අපනයන වෙළඳපල විවිධාංගීකරණය | Camso Loadstar (Pvt) Ltd |
| 9 | හොඳම ශ්‍රී ලාංකීය අපනයන සන්නම් නාමය | Akbar Brothers (pvt) Ltd |
| 10 | ඉහළතම ශුද්ධ විදේශ විනිමය උපයන්නා | Brandix Apparel Limited |
| 11 | වසරේ ශ්‍රී ලාංකීය අපනයනකරු | Brandix Apparel Limited |

## 01) ප්‍රතිපත්ති ආරම්භයන්

**ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම**

2017 වසර තුළ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාවේ නංවන ලද ප්‍රධාන ප්‍රතිපත්තිමය මට්ටමේ වැඩසටහන වනුයේ ජිනීවා, අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානයේ සහයෝගයෙන් ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම සැකසීමේ කර්තව්‍යයයි.

2016 ඔක්තෝබර් මස ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කළ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් රටේ ජාතික ආදායම ඉහළ නැංවීම, රැකියා උත්පාදනය සහ ශ්‍රී ලංකාවේ වෙළඳ හිඟය අඩු කිරීම යනාදී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යාවශ්‍ය ක්ෂේත්‍රයක් වන අපනයන සංවර්ධනය කිරීමෙහිලා අවශ්‍ය ප්‍රතිසංස්කරණ, නවෝත්පාදන නිෂ්පාදන හඳුන්වා දීම සහ විවිධාංගීකරණය ඉහළ නැංවීමට නව උපාය මාර්ගයන්ට පිවිසීමේ වැදගත්කම අවධාරණය කරන ලදී.

සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යාංශය, අපනයන සංවර්ධන මණ්ඩලය සහ අදාල රාජ්‍ය සහ පෞද්ගලික අංශ මෙන්ම වාණිජ මණ්ඩලයන්ගේ ද සහභාගීත්වයෙන් ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමේ කටයුතු සිදු කෙරේ. මෙම කර්තව්‍යයේ නියමුවා ගරු ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාය. මීට අමතරව ජේෂ්ඨ රාජ්‍ය සහ පෞද්ගලික නිලධාරීන්ගෙන් හා අන්තර්ජාතික වෙලඳ මධ්‍යස්ථානයේ උපදේශකයෙකුගෙන් සමන්විත ඉහළ කමිටුවක් ස්ථාපනය කර එමගින් ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමේ කර්තව්‍යය සඳහා උපදේශන සේවා ලබා ගැනීම මෙන්ම දිශානතිය පිළිබඳව අවධානය යොමු කෙරේ.

වෙළඳ විශ්ලේෂණය අගය දාම ප්‍රගතිය, වෙළඳ දිශානතිය, උපාය මාර්ගික, කලාපිය සහ අංශයන් හී විශේෂිත රාජ්‍ය සහ පෞද්ගලික පාර්ශවකරුවන් එක්ව උපදේශන සැසි පවත්වන ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලිය මගින් ප්‍රමුඛ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා අදාල ආයතනයන්ගේ ආර්ථික සංවර්ධන වැඩසටහන් සහයෝගයෙන් සිදු කිරීමට අවශ්‍ය පරිසරය සකසනු ලැබේ.

ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලියේ පළමු ජාතික සම්මන්ත්‍රණය, 150 කට අධික රාජ්‍ය හා පෞද්ගලික අංශ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් රටේ ඉදිරි අපනයන වර්ධනය සැලසුම් කිරීම සඳහා පවත්වන ලදී. යුරෝපා සංගමයේ ව්‍යාපෘතියක මූල්‍ය අනුග්‍රහයෙන් සහ අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානයේ තාක්ෂණික සහයෝගයෙන් මෙම ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමේ කටයුතු සිදු කෙරේ.





2017 අප්‍රේල් මස පවත්වනු ලබන මෙම උපදේශන සැසි මගින් ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනයක් සඳහා එකඟ වූ උපාය මාර්ගික දැක්ම වනුයේ ශ්‍රී ලංකාව - නවෝත්පාදන සහ ආයෝජන මගින් ක්‍රියාත්මක වන අපනයන මධ්‍යස්ථානයක් යන්නයි. මෙමගින් සමස්ත ජාතික උපාය මාර්ගික සැලැස්ම සැකසීමේ

ක්‍රියාවලියට මාර්ගෝපදේශකත්වය ලබාදෙන ප්‍රධාන උපාය මාර්ගික අරමුණු සඳහා මහඟු පිටුවහලක් ලබා දේ.

- අපනයන ක්ෂේත්‍රය සඳහා ව්‍යාපාර සඳහා හිතකර, ඉලක්ක ලබාගත හැකි සහ ඉතා පැහැදිලි ප්‍රතිපත්තියක් සහ නියාමන රාමුවක් සැකසීම.
- නවෝත්පාදනයෙන් සහ නැගී එන අපනයන ක්ෂේත්‍රයන් ශක්තිමත් කිරීමෙන් අපනයන විවිධාංගීකරණය කිරීම.
- ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ගේ වෙළඳපල පිවිසීමේ හැකියාව සහ අනුකූල වීමේ හැකියාවන් වැඩි දියුණු කිරීම.
- අපනයන ක්ෂේත්‍රට පහසුකම් සැලසීම සඳහා කාර්යක්ෂම වෙළඳ සහ කාර්ය උපාය (Logistics) මධ්‍යස්ථානයක් බවට පත්කිරීම.

ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම තුලින් ශ්‍රී ලංකාවේ ආර්ථික දැක්ම වන තිරසාර වර්ධනයක් අත්පත් කර ගැනීමට රටේ පෞද්ගලික අංශයේ තරඟකාරීත්වය ශක්තිමත් කිරීමෙහිලා විශාල කාර්යභාරයක් සිදු කෙරේ. ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන විවිධාංගීකරණය සහ නව ඉලක්ක වෙළඳපලට පිවිසීමේදී මෙම උපදේශාත්මක කර්තව්‍ය මගින් අදාල රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා පොදු සැලසුම් සකස් කිරීමට හැකි වේ. එමෙන්ම මෙමගින් අපනයන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමුඛ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් සැකසේ. ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම මගින් ශ්‍රී ලංකාවේ අපනයන තරඟකාරීත්වය පිළිබඳ සිදු කරන ලද ප්‍රමාණාත්මක සහ ගුණාත්මක විශ්ලේෂණයන් පදනම් කර ගනිමින් තෝරාගත් ප්‍රමුඛ අපනයන ක්ෂේත්‍රයන් සහ හඳුනාගත් ප්‍රධාන වෙළඳ සහයෝගී ක්‍රම පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ. මෙම තෝරාගත් ප්‍රමුඛ ක්ෂේත්‍රයන් මගින් අපනයන ක්ෂේත්‍රයේ ඉහළ වර්ධනයක් අත්පත් කර ගැනීමට වැඩි දායකත්වයක් දක්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම මගින් අදාල රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල අපනයන සංවර්ධන වැඩසටහන් සහයෝගයෙන් ක්‍රියාත්මක කිරීමේදී සැලැසුම් සකස් කිරීමට සුදුසු වාතාවරණයක් සකසනු ඇත.

**වෙළඳ සහයෝගී ක්‍රම**

ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්මේ දැක්ම සහ උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කරගැනීමට සහ ජාතික ව්‍යාපාර පරිසරය සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් වෙළඳ සහයෝගී ක්‍රම තෝරාගන්නා ලදී. මෙම වෙළඳ සහයෝගී ක්‍රම මගින් ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ක්ෂේත්‍රයේ තරඟකාරීත්වය ඉහළ නැංවීමට විශාල මෙහෙවරක් ඉටුවේ යැයි අපේක්ෂා කෙරේ.

- වෙළඳ තොරතුරු සහ ප්‍රවර්ධනය
- ජාතික තත්ත්ව යටිතල පහසුකම්
- නවෝත්පාදනය සහ පර්යේෂණ හා සංවර්ධන
- කාර්ය උපාය (Logistics)

2017 ජූලි මස 12 සිට 20 දක්වා දෙවන උපදේශන සැසි පවත්වන ලදී. අපනයන ක්ෂේත්‍ර ව්‍යාප්ත කිරීම සඳහා මාර්ග සිතියම් සැකසීම සහ ජාතික අපනයන උපාය මාර්ගික සැලසුම මගින් තෝරාගත් ඉලක්ක ක්ෂේත්‍රයන්ගේ අගය දාමයන්ගේ ප්‍රගති විශ්ලේෂණය, වෙළඳපල දිශානතීන් සහ අවස්ථාවන් හඳුනා ගැනීම යනාදීන් මෙම සැසි පැවැත්වීමේ ප්‍රධාන අරමුණු විය. වෙළඳ සහයෝගී ක්‍රම යටතේ එම කණ්ඩායම් විසින් ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට තත්ත්වයෙන් උසස් හා අත්‍යවශ්‍ය වෙළඳ සහයෝගී සේවා ලබා දීමේදී ඇතිවන ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. ඉන් අනතුරුව 2017 අගෝස්තු 8 සිට සැප්තැම්බර් 12 දක්වා දිනයන්හි දී හඳුනාගත් අපනයන ක්ෂේත්‍රයන් සහ වෙළඳ සහයෝගී ක්‍රම සඳහා සැසියන් පවත්වන ලදී.

එමෙන්ම 2017 සැප්තැම්බර් 18 සිට 22 දක්වා මහනුවර, යාපනය සහ ගාල්ල නගරයන්හි දී ශ්‍රී ලංකාවේ ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමේදී අත්‍යවශ්‍ය අංගයක් වූ කලාපීය උපදේශනය ලබාගැනීම සඳහා සැසියක් පවත්වන ලදී. මේ සඳහා මධ්‍යම, උතුරු සහ දකුණු පලාත් නියෝජනය කරමින් අදාල පාර්ශවකරුවන් රැසක් සහභාගී විය. මධ්‍යම පලාත් පැවැත් වූ සැසිය කුළු බඩු හා සාන්ද්‍රිත නිෂ්පාදන සහ සුව සේවා සංස්කරණ ඉලක්ක කරගනිමින් පැවැත්විය. එමෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා අදාල මෙන්ම යාවත්කාලීන වෙළඳ තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව වර්ධනය කිරීම සඳහා වෙළඳ තොරතුරු හා ප්‍රවර්ධනය යන හඳුනාගත් වෙළඳ සහයෝගී ක්‍රමය පිළිබඳ විශේෂිත සැසියක් ද පවත්වන ලදී. ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාවට නැංවීම තුලින් හඳුනාගත් ප්‍රමුඛ ක්ෂේත්‍රයන් මගින් පමණක්ම නොව අනෙකුත් සමස්ත අපනයන ක්ෂේත්‍රන්ගේම ප්‍රතිඵලයක් ලෙස රැකියා උත්පාදනය සිදුවේ යැයි අපේක්ෂා කෙරේ. ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම සැකසීමේදී පලාත් නියෝජනය මගින් ඔවුන්ගේ ගැටලු සහ අවස්ථා සැලකිල්ලට ගැනීම ඉතා වැදගත් වේ. එමෙන්ම දේශිය ව්‍යවසායකයින් අතර පලාත් සබඳතා මෙන්ම අනෙකුත් රටවල වෙළඳ ගැනුම්කරුවන් සමග ද ව්‍යාපාර සබඳතා ඇති කරගැනීමේ දී ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම ප්‍රයෝජනවත් වනු ඇත .දැනට 2018 වසරේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත අයවැය යෝජනාවන් හි ඇතුලත් ප්‍රමුඛ අපනයන සංවර්ධන කාර්යයන් මෙන්ම ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්මේ දැක්ම සහ උපාය මාර්ගික අරමුණු මත පදනම් වූ ක්‍රියාකාරී සැලසුම්වල අනුකූලතාව පිළිබඳ පාර්ශවකරුවන් විසින් සාකච්ඡා කරමින් සිටී.

**හාවඩ් විශ්වවිද්‍යාලයේ කෙනඩි පාසැල මගින් සංවිධානය කරන ලද අපනයන ක්ෂේත්‍රයේ ගැටලු හඳුනා ගැනීමේ සහ ඒවාට සුදුසු විසඳුම ලබාදීමේ ව්‍යාපෘතිය**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අන්තර්ජාතික සංවර්ධනය පිළිබඳ හාවඩ් මධ්‍යස්ථානය හා එක්ව අපනයන ක්ෂේත්‍රන් විශ්ලේෂණය, ක්ෂේත්‍රයේ ගැටලු හා ප්‍රශ්න හඳුනා ගැනීම සහ එමගින් නව අපනයනයන් ප්‍රවර්ධනය සිදුකරමින් ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. බෝට්ටු ගොඩනැංවීමේ කර්මාන්තය, ඉලෙක්ට්‍රොනික (මුද්‍රිත පරිපථ පුවරු), විද්‍යුත් (ආවර්ණය කරන ලද කම්බි) සහ මෝටර් රථ කර්මාන්තය හා සම්බන්ධ උපාංග (විශේෂයෙන් වල්කනයිස් රබර් නිෂ්පාදන) යනාදී අපනයන භාණ්ඩ සංවර්ධනය සඳහා පළමු අදියරේදී තෝරාගන්නා ලදී. මෙහිදී අපනයන නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමෙන් ඉහළ අපනයන වර්ධනයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් තෝරාගත් අපනයන ක්ෂේත්‍රයන් සඳහා පොදු ගැටලු හඳුනාගත් අතර, ඉන් පරීක්ෂණ පහසුකම් හා ශ්‍රමික ඌනතා ගැටලු විසදීමේ අපේක්ෂාවෙන් අදාල රාජ්‍ය හා පෞද්ගලික පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් රැස්වීම් දෙකක් පවත්වන ලදී.

පරීක්ෂණ පහසුකම් පිළිබඳ ගැටලු විසදීම සඳහා පැවති රැස්වීමේ ප්‍රතිඵලයක් ලෙස විශේෂයෙන් රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන ක්ෂේත්‍රයන් හි නිරත අපනයනකරුවන් සඳහා ශ්‍රී ලංකාවේ පවත්නා පර්යේෂණ පහසුකම් පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් 2017 අප්‍රේල් 3 වන දින පවත්වන ලදී.

මීට අමතරව සම්මන්ත්‍රණයට සහභාගීවූවන්ගේ කැමැත්ත පරිදි ඔවුන්ට කාර්මික තාක්ෂණ ආයතනයේ රසායනාගාර සේවා නැරඹීමේ අවස්ථාවක් ද අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී එමෙන්ම සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් මහනුවර පවත්වනු ලැබූ රැකියා පොල සඳහා අපනයන සමාගම් තුනක් සහභාගී කරවන ලදී .

2018 ජාතික අය වැය සඳහා විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍ර සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන යනාදී අනෙකුත් කාර්මික නැගී එන අපනයන නිෂ්පාදන ක්ෂේත්‍රයන් සංවර්ධනය හා ප්‍රවර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ අපනයන විවිධාංගීකරණය සඳහා අත්‍යාවශ්‍ය පවතින පර්යේෂණ පහසුකම් වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙන් අයවැය යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර ලෙස අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයන සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ සේවා (Internet of Things), විද්‍යුත් පරිපථ පුවරු (HS 8537) සහ මෝටර් රථ උපාංග (HS8708) යන නිෂ්පාදන ක්ෂේත්‍ර තෝරා ගන්නා ලදී. ඒ අනුව එම ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි තෝරා ගත් අපනයන සමාගම් සම්මුඛ පරීක්ෂණයන්ට ලක් කර එමගින් ඔවුන්ගේ ගැටලු හඳුනා ගෙන ඉන් ප්‍රමුඛතම පොදු ගැටලු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරන ලදී. තෝරා ගත් අපනයන නිෂ්පාදන ක්ෂේත්‍රයන් සඳහා සියලු තොරතුරු ඇතුලත් පත්‍රිකා (Pitch Books) සකස් කර ඒවා විදේශීය රටවල ශ්‍රී ලංකා වෙළඳ දූත මණ්ඩලයන් වෙත යොමු කරන ලදී.

**02) අපනයනය ආශ්‍රිත ව්‍යවසායකත්ව සංවර්ධනය**

**නව අපනයනකරුවන් 2000 ක් බිහි කිරිමේ ජාතික වැඩසටහන**

2017 වසරේදී අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2017-2022 වසර පහක කාලයක් තුල නව අපනයනකරුවන් 2000 ක් බිහි කිරිමේ ජාතික වැඩසටහන දියත් කරන ලදී. මෙම වැඩසටහන සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වේ.

2022 වසරේ දී අපනයන ආදායම ඇ.ඩො.බි. 22 ක් ළඟා කර ගැනීමේ අපනයන ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා දේශිය ව්‍යවසායකයන් අපනයන කර්මාන්තයේ ආයෝජනය කිරීම දිරිමත් කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. මෙම වැඩසටහන සඳහා කැමැත්තක් දක්වන එමෙන්ම සුදුසු ව්‍යවසායකයින් හඳුනාගැනීම වැදගත් වන අතර රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ගේ පාර්ශවකරුවන්ගේ සහයෝගයෙන් දේශිය ව්‍යවසායකයන් අපනයනකරුවන් ලෙස සංවර්ධනය කිරීම සඳහා පවත්නා අවශ්‍යතා පිළිබඳ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය වේ.

මේ යටතේ පළමු වැඩසටහන, 2017 මාර්තු 23 දින යාපනයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී 250කට අධික ව්‍යවසායකයින්ගේ සහභාගීත්වයෙන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. එහිදී උතුරු පලාතේ පවත්නා මානව හා භෞතික සම්පත් සැලකිල්ලට ගනිමින් අපනයනය සඳහා සංවර්ධනය කිරීමට සුදුසු ක්ෂේත්‍ර ලෙස සකස් කළ ආහාර, අත්කම් නිෂ්පාදන, ධීවර නිෂ්පාදන සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ සේවා යනාදිය හඳුනා ගන්නා ලදී. සම්මන්ත්‍රණයට සමගාමීව අපනයන නිෂ්පාදන ප්‍රදර්ශනයන් සහ ව්‍යාපාරික සායනයක් ද පවත්වන ලදී. ව්‍යවසායකයින් 143 ක් මෙම ව්‍යාපාරික සායනය සඳහා සහභාගී වූ අතර ගැටලු 100 කට අධික ප්‍රමාණයක් සඳහා සුදුසු විසඳුම් ලබා දීමට හැකි විය. ව්‍යවසායකයින්ගේ අවශ්‍යතා විශ්ලේෂණයකින් අනතුරුව ඔවුන් අපනයනයට සූදානම්, අපනයනයට සුදුසු සහ කුඩා යනුවෙන් ප්‍රධාන ප්‍රභේදයන් තුනකට වෙන් කරන ලදී. ඔවුන් අදාල සම්මන්ත්‍රණයන්ට සහභාගී කරවීමට සහ නිෂ්පාදනයන්ට අවශ්‍ය සහතික ලබා ගැනීමට යොමු කරවීමට මණ්ඩලය විසින් කටයුතු කරන ලදී.

මෙයට අමතරව, නව දිල්ලි නගරයේ පැවැත්වුණු පළමුවන ඉන්දියා පොදු රාජ්‍ය මණ්ඩලීය සුළු හා මධ්‍ය පරිමාන ව්‍යවසායකයින්ගේ වෙළඳ සමුළුව සඳහා සහභාගී වීමේ අවස්ථාව උතුරු පලාතේ ව්‍යවසායකයින් දෙදෙනෙකුට ලබා දෙන ලදී. මීට අමතරව, තවත් ව්‍යවසායකයින් දෙදෙනෙකුට තායිලන්තයේ පැවැත්වුණු "Thaitex World of Food Asia 2017" ප්‍රදර්ශනය නැරඹීම සඳහා අවස්ථාවක් ලබාදෙන ලදී. එමෙන්ම 2018 ජනවාරි මස යාපනයේ පැවැත්වුණු 9 වන යාපන අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනය සඳහා උතුරු පලාතේ තෝරාගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 8 දෙනෙකුට තම නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාව ලබා දෙන ලදී.







මෙම වැඩ සටහනේ දෙවන අදියර 2017 අප්‍රේල් 28 වන දින පල්ලෙකැලේ පිහිටි මධ්‍යම පලාත් කාර්යාලයේ දී 250 කට අධික ව්‍යවසායකයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. මෙහි දී 2017 වසර තුල අපනයනකරුවන් බවට පත් කිරීමට සුදුසු සමාගම් 25ක් හඳුනා ගන්නා ලදී.

එමෙන්ම තුන් වසරක කාල පරිච්ඡේදයක් තුල අපනයනකරුවවන් ලෙස කළ සංවර්ධනය හැකි ව්‍යවසායකයන් 106 දෙනෙකු හඳුනා ගන්නා ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදු කරන ලද ව්‍යවසායකයින්ගේ අවශ්‍යතා විශ්ලේෂණය මගින් උපායමාර්ග සකස් කිරීම සිදු කෙරේ. මධ්‍යම පලාතෙන් හඳුනා ගත් අපනයනය කිරීමට සූදානම් ව්‍යවසායකයන් දෙදෙනෙකු නව දිල්ලිහි පිහිටි පලමු ඉන්දීය පොදු රාජ්‍ය මණ්ඩලීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා වූ වෙළඳ සමුළුවට සහභාගී කරවන ලදී. මීට අමතරව, මහනුවර දී කලාපයේ අපනයනකරුවන් සඳහා යුරෝපා GSP+ සහනය මගින් ලැබෙන වාසි පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. මෙමගින් මධ්‍යම පලාතේ හඳුනා ගත් සමාගම් දෙකක් අපනයන වෙළඳපළට ප්‍රවිෂ්ට වී ඇත.

මෙයට අමතරව, අපනයන ක්‍රියාවලිය, ඇසුරුම්කරණය සහ ලේබල් කිරීම යනාදී විවිධ අංශයන් ඔස්සේ කලාපීය තෝරාගත් ව්‍යවාසායකයන් සඳහා දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ රාශියක් පවත්වන ලදී. එමෙන්ම මෙම වැඩසටහන යටතේ හඳුනා ගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවාසයකයින් 5 දෙනෙකුට 14 වන චීන අන්තර්ජාතික සුළු හා මධ්‍ය ව්‍යවසායකයින්ගේ ප්‍රදර්ශනයට සහභාගී වීමේ අවස්ථාව සලසා දෙන ලදී. එමෙන්ම ව්‍යවසායකයින් 4 දෙනෙක් 2018 පෙබරවාරි ඩුබායි හි පැවැති “Gulf Food & Beverage” අන්තර්ජාතික ප්‍රදර්ශනය සඳහා සහභාගී කරවන ලදී.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ලබා දෙන සහන

- ලියාපදිංචි වූ ව්‍යවසායකයින් සඳහා ඔවුන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම
- ආදර්ශ ව්‍යාපෘති/ සාධනීය අධ්‍යයන වාර්තා ලබා දීම
- බැංකු ණය ලබා ගැනීමේ දී පහසුකම් සැලසීම (අවශ්‍ය නම්)
- තාක්ෂණ හුවමාරු/යන්ත්‍රෝපකරණ ලබා ගැනීම/පුහුණු වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම
- නිෂ්පාදන හා වෙළඳපල සංවර්ධන වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම

**කාන්තා ව්‍යවසායකත්වය**

කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් මගින් කාන්තා ව්‍යවසායකයන් අපනයන ක්ෂේත්‍රයට එකතු කිරීම සිදු කෙරේ. 350 ක කාන්තා ව්‍යවසායකයින්ගේ සමන්විත තොරතුරු පද්ධතියක් සකස් කරන ලදී. කිලිනොච්චි නගරයේ පැවැති පුහුණු වැඩසටහන සඳහා කාන්තා ව්‍යවසායකයන් 100 ක් සහභාගී කරවන ලදී.

2017 මාර්තු 27 සිට 29 දක්වා දිනයන් හි ඉන්දියාවේ මුම්බායි හි පැවැති ගෝලීය ආර්ථික සමුළුව සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කාන්තා ව්‍යවසායකයන් 3 දෙනෙකුගෙන් සමන්විත ශ්‍රී ලාංකා

වෙළඳ මණ්ඩපය ඉදිරිපත් කරන ලදී. මෙමගින් ශ්‍රී ලංකාවේ කාන්තා ව්‍යවසායකයන් සඳහා පැවැත් වූ පළමු වැඩසටහන වන අතර එමගින් අන්තර්ජාතික වෙළඳපලට ඔවුන්ගේ භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනය කිරීමට අවස්ථාව ලැබේ. මෙහි දී 100 කට අධික වෙළඳ විමසුම් ප්‍රමාණයක් ලැබුණු අතර ඇ.ඩො. 700ක් වටිනාකමින් යුතු නිෂ්පාදන ප්‍රදර්ශන පරිශ්‍රයේ දීම අලෙවි විය.

**එක ගමකට එක් නිපැයුමක්**

වයඹ පලාතේ තෝරා ගත් අගය එකතු කළ නිෂ්පාදන සඳහා මෙම වැඩසටහන යටතේ ගොවි කණ්ඩායම් සකස් කර සෘජු අපනයනකරුවන් හා සම්බන්ධ කරන ලදී. ගම්මිරිස්, කුරුඳු, එනසාල්, කරපිංචා, මුරුංගා, වැල් දොඩම්, කැප්පු මල් සහ කොළ, ඉඟුරු, අන්නාසි යනාදී තෝරාගත් නිෂ්පාදන ගොවි කණ්ඩායම විසින් අක්කර 850 ක වපසරියක් පුරා වගා කිරීමට ආරම්භ කරන ලදී.

මධ්‍යම පලාතේ කරාබුනැටි සහ ගම්මිරිස් වගා කිරීම සඳහා සුදුසු අක්කර 175ක් සහ දකුණු පලාතේ වැල් දොඩම් වගා කිරීම සඳහා සුදුසු අක්කර 80ක් හඳුනා ගන්නා ලදී . ගොවීන් තෝරා ගැනීමේ කටයුතු අවසන් කර ඇති අතර වගා කිරීමේ ද්‍රව්‍ය බෙදා හැරීමට සහ බැංකු ණය සඳහා පහසුකම් සැලසීම ආරම්භ කරන ලදී.

**03) ගෝලීය අගයදාම/ ගෝලීය නිෂ්පාදන ජාලයන් හා සම්බන්ධ වීම**

**තායිලන්තයේ බැංකොක් හි 2017 මැයි 31 සිට ජුනි 4 දක්වා පවත්වනු ලැබූ Thaifex 2017**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 8 දෙනෙකු සඳහා තායිලන්තයේ වෙළඳපල ගවේෂණ වැඩසටහනක් සංවිධානය කරන ලද අතර ඔවුන් Thaifex 2017 ප්‍රදර්ශනය නැරඹීමේ අවස්ථාව ද සලසා දෙන ලදී. එමෙන්ම ඔවුන්ට තායි ඇසුරුම් මධ්‍යස්ථානයේ එක් දිනක පුහුණු වැඩසටහනකට සහභාගී වීමට හැකි වූ අතර අගය එකතු කළ සහල් නිෂ්පාදන කම්හලක් තක්කාලි විජලණයට නිෂ්පාදන කර්මාන්ත ශාලාවක්, තල් ආශ්‍රිත ආහාර සහ පාන නිෂ්පදාන කර්මාන්ත ශාලා නැරඹීම මෙන්ම තායිලන්ත Good Market සඳහා අධ්‍යයන චාරිකාවක නිරත වීමේ අවස්ථාවද හිමි විය.

මෙම වැඩසටහනට සහභාගී වූවන්ට තායිලන්තයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ භාවිතා වන තාක්ෂණය පිළිබඳ නව දැනුම ලබා ගැනීමට හැකි විය. වාරි කර්මාන්තයේ සුදුසු තාක්ෂණ ක්‍රම යොදා ගැනීම, තත්ත්වයෙන් උසස් බීජ වර්ග භාවිතය සහ සුදුසු කෘෂි තාක්ෂණ ක්‍රම භාවිතය නිසා තායිලන්තයේ ඒකකයකට ලැබෙන අස්වැන්න ඉහළ අගයක් ගනී.

මෙම වැඩසටහනට සහභාගී වූ සමහරෙක් ඔවුන්ගේ නිෂ්පාදන පහසුකම් වර්ධනය කිරීමට දැනුම ලබාගත් අතරම තවත් සමහරු මෙහිදී ලබාගත් දැනුම පදනම් කර ගනිමින් නව ව්‍යාපාර ඇරඹීමට ද දිරිමත් වූහ. එමෙන්ම මෙම වැඩසටහනට සහභාගී වූ දෙදෙනෙක් හවුල් ව්‍යාපාරයකට ද අඩිතාලමක් දැමූහ.

Thaifex 2017 අන්තර්ජාතික ප්‍රදර්ශනය මගින් ශ්‍රී ලංකීය නියෝජිත පිරිසට නව නිෂ්පාදන/වෙළඳපල ප්‍රවණතා (Gluten නොමැති, හලාල්, කොෂර්) පිළිබඳ දැනුම ලබා ගැනීමට අවස්ථාව හිමි විය. එමෙන්ම තායිලන්තයේ සිදු කෙරෙන විවිධ ආහාර ඇසුරුම් ක්‍රම, තත්ත්ව සුරක්ෂිත බව සඳහා ඇසුරුම් පරික්ෂාව, ආහාර විජලනය සහ තත්ත්ව පාලන විධි පිළිබඳ ගවේෂණය කිරීමේ අවස්ථාව හිමි විය.

**විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සහ අපනයනකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්**

2017 නොවැම්බර් 27 – 30 දක්වා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ජාතික ජලජීවී සංවර්ධන ආයතනය හා එක්ව මැලේසියාවේ INFOFISH ආයතනයේ උපදේශකවරයකුගේ සහභාගීත්වයෙන් රම්බොඩගල්ල විසිතුරු මත්ස්‍ය බෝ කිරීමේ පුහුණු මධ්‍යස්ථානයේ දී පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

මෙහි දී විසිතුරු මසුන් ප්‍රවාහනය, “Koicarp”, “Tetras”, “Catfish”, “Flowerhorn” යන මත්ස්‍ය ප්‍රභේද අභිජනනය, උසස් ඇසුරුම් ධාරිතාව මගින් මරණ සංඛ්‍යාව අඩු කිරීම යනාදී විවිධ මාතෘකා යටතේ දේශන පැවැත් වූ අතර මේ සඳහා ව්‍යවසායකයන් 80 දෙනෙකු සහභාගී විය.

**තායිලන්තයේ බැංකොක් හි 2017 නොවැම්බර් 22 සිට 25 දක්වා පැවැති මෝටර් රථ උපාංග නිෂ්පාදකයන් සඳහා ප්‍රවර්ධන වැඩසටහන**



අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තායිලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා එක්ව ශ්‍රී ලාංකීය ව්‍යවසායකයන් නව දෙනෙකුට (09) තායිලන්තයේ මෝටර් රථ නිෂ්පාදන සමාගම් සඳහා උපාංග සැපයීමේ සහ ශ්‍රී ලංකාවේ බද්ධ ව්‍යාපාර ස්ථාපනය කර ගැනීමේ අවස්ථා ගවේෂණය සඳහා අවස්ථාව ලබා ගැනීමේ අරමුණුවලින් යුක්තව තායිලන්තයේ දී වැඩසටහනක් පළමු වරට සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනට ව්‍යාපාරික හමුවන්, Metalex ප්‍රදර්ශනය නැරඹීම, මෝටර් රථ හා මෝටර් රථ උපාංග නිෂ්පාදනය කිරිමේ කර්මාන්ත ශාලා නැරඹීම සහ අදාල සංගම් හා ආයතන සමඟ සාකච්ඡා අන්තර්ගත විය.

Metalex ප්‍රදර්ශනය නැරඹීමෙන් ශ්‍රී ලාංකීය ව්‍යවසායකයන්ට මෝටර් රථ උපාංග නිෂ්පාදනයේ දී ලෝහ භාවිතය පිළිබඳ ගවේෂණය කිරීමේ අවස්ථාව හිමි විය. එමෙන්ම ඔවුන්ට තායි කර්මාන්ත සම්මේලනය, තායි මෝටර් රථ කර්මාන්ත සංගමය, බැංකොක් අන්තර්ජාතික වෙළඳ හා ප්‍රදර්ශන ශාලාවේ පිහිටි තායි මෝටර් රථ උපාංග නිෂ්පාදකයන්ගේ සංගමය සහ තායිලන්ත ආයෝජන මණ්ඩලය යනාදී ආයතන සමඟ සාකච්ඡා පැවැත්වීමේ අවස්ථාව ද හිමි විය. Summit Auto Body Industry, Summit Auto Tech Industry, Thai Reng Union Car Public Co. Ltd සහ Mercedes Benz එකලස් කිරීමේ මධ්‍යස්ථානය යනාදී සමාගම් නැරඹීමෙන් ශ්‍රී ලාංකීය සමාගම්වලට තායිලන්ත මෝටර් රථ/මෝටර් රථ උපාංග නිෂ්පාදනය පිළිබඳ දැනුම ලබා ගත හැකි විය.

ශ්‍රී ලාංකීය නියෝජිත පිරිස තායිලන්තයේ Summit Group සඳහා ක්‍රම නිෂ්පාදන පිළිබඳ තොරතුරු ප්‍රදර්ශනය කිරිමෙන් තායිලන්ත සමාගම් තුළ හොඳ ප්‍රතිරූපයක් ඇති කර වෙළඳ ඇණවුම් ලබා ගත්හ. එමෙන්ම ශ්‍රී ලාංකීය පිරිසට මෝටර් රථ අමතර කොටස් කුටි 1000කට අධික ප්‍රමාණයකින් සමන්විත Poonsup වෙළඳපළටද සංචාරයක නිරත වීමේ හැකියාව ලැබිණ. එහිදී ශ්‍රී ලාංකීය සමාගම් මෙම වෙළඳපලට මෝටර් රථ උපාංග සැපයීමේ අවස්ථාව පිළිබඳ සොයා බලා ගිවිසුම් කිහිපයකට එළඹියහ.





එසේම ඔවුන්ට Eastern Seaboard කාර්මික කලාපය නැරඹීමට ලැබුනු අවස්ථාවෙන් ලොව ඉතාම උසස් ගණයේ කාර්මික කලාපයක් පිළිබඳ දැන ගැනීමට හැකි විය. මෙමගින් පාරිභෝගිකයාට අවශ්‍ය පරිදි ස්ථානය තෝරා ගැනීම, සංවිධාන කටයුතු (Logistical) සඳහා දේශිය විදේශිය පාරිභෝගිකයන්ට වැයවන පිරිවැය දීර්ඝ කාලීනව අවම කරමින් තත්ත්වයෙන් උසස් ඉදිකිරීම් සහ උසස් මට්ටමේ නිර්මාණ ලබාදීම සිදු කෙරේ.

**රබර් නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා පද්ධති සංවර්ධන වැඩසටහන**

රබර් හා රබර් නිෂ්පදාන ක්ෂේත්‍රය සඳහා තත්ත්ව සහතික ලබාදීමේ වැඩසටහන යටතේ ISO 14001 සහ 50001 සහතික ලබා ගැනීම සඳහා පුහුණු වැසටහන් 2ක් සංවිධානය කරන ලදී. එම සහතික ලබා ගැනීම සඳහා එක් දින අන්තර් විගණන පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබීය. දැනට සමාගම් 6ක් ISO 14001 සහ 50001 සහතික ලබා ගෙන ඇත.

**පාවහන් නිෂ්පාදකයින් සඳහා පාවහන් නිෂ්පාදන ඉංජිනේරු වැඩසටහන**

2017 ජනවාරි මාසයේ 2017 දී ජාත්‍යන්තර විශේෂඥ සමාගමක සේවා වන් ලබා ගැනීමෙන් නිෂ්පාදන ගුණත්වය වැඩිදියුණු කිරීම සඳහා තෝරා ගත් පාවහන් නිෂ්පාදකයින්/ අපනයනකරුවන් 6 දෙනෙක් සඳහා මෙම වැඩසටහනේ පළමු අදියර සංවිධානය කරන ලදී.

පළමු අදියරේ දී නිෂ්පාදන සහ නිෂ්පාදන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා විශේෂඥයින් විසින් දැනුම ලබා දුන් අතර සැප්තැම්බර් මාසයේ දී දෙවන අදියර යටතේ දී ජාත්‍යන්තර වෙළඳපොළට ගැළපෙන වැඩිදියුණු කරන ලද නිෂ්පාදන පෙළක් සඳහා යෝජිත වෙනස්කම් ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගි වන්නන්ට උපදේශකත්වය ලබා දීම සිදු කරන ලදි.

**තාක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන**

2017 සැප්තැම්බර් 26 සිට 29 දක්වා චීනයේ පැවැත්වුන CISMA ප්‍රදර්ශනය හා සමගාමී ව ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වෙළඳපොළේ පවතින නව තාක්ෂණය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලාංකීය ඇඟලුම් සමාගම් 7 ක නියෝජිතයින් 10 දෙනෙකු සහභාගී වූහ. මෙම ප්‍රදර්ශනයට සහභාගී වූ ශ්‍රී ලාංකීය නියෝජිතයින් නව යන්ත්‍ර මිල දී ගැනීම සඳහා සාකච්ඡා පවත්වමින් ඔවුන්ගේ සමාගම්වල ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමට කටයුතු ආරම්භ කරන ලදි.

**නිෂ්පාදිත සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අපනයනකරුවන්ගේ ප්‍රයත්නයන් ට සහන සැලසීමේ යෝජනා ක්‍රමය**

අපනයන නිෂ්පාදන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ අරමුණින් පිරිවැය කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා අපනයන නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම හා අපනයන වලින් ඉහළ වටිනාකමක් ලබා ගැනීම සඳහා නිෂ්පාදකයින් දිරි ගැන්වීම / නිෂ්පාදන ක්‍රියාවලියේ තිරසාරත් වය ඉහළ නැංවීම සඳහා නව යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදි.

මේ වන විට අපනයන සංවර්ධන මණ්ඩලය, ඇඟලුම් සමාගම් පහක්(05) සමඟ වැඩ කටයුතු අරම්භ කර ඇති අතර, පාවහන් නිෂ්පාදන සමාගම් දෙකක්, විද්‍යුත් සමාගම් දෙකක් සහ එක් සැහැල්ලු ඉංජිනේරු සමාගමක් සමඟ ඔවුන්ගේ නිෂ්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම හා බලශක්ති කාර්යක්ෂම නිෂ්පාදන හඳුන්වා දීමේ කාර්යයන් ආරම්භ කර තිබේ.

**04) ශ්‍රී ලාංකේය නිෂ්පාදන හා සේවා සඳහා වෙළෙඳපොළ ප්‍රවේශය ලබා ගැනීම**

**2017 සැප්තැම්බර් 24 සිට 28 දක්වා ග්‍රීසියේ පැවැත්වූ IFEAT සමුළුව**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙම සම්මන්ත්‍රණය සඳහා ශ්‍රී ලාංකීය සමාගම් 02 ක් සහභාගී කර වීය. ඇමෙරිකන් ඩොලර් 242,000 ක් වටිනා ඇණවුම් ලබා ගැනීමට සහභාගි වූ සමාගම් වලට හැකි විය. එමෙන්ම එක්සත් රාජධානිය, ජපානය, ජර්මනිය, ප්‍රංශය සහ ඇමරිකා එක්සත් ජනපදයේ ගැනුම්කරුවන් සමඟ නව සබඳතා ආරම්භ විය.

**2017 පෙබරවාරි 8 දින සිට 10 දින දක්වා කොළඹ දී පැවැත් වූ ජාත්‍යන්තර විසිතුරු මසුන් වෙළෙඳ සහ තාක්ෂණික සමුළුව**

දෙවන ජාත්‍යන්තර විසිතුරු මසුන් වෙළෙඳ සහ තාක්ෂණික සමුළුව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මැලේසියාවේ INFOFISH ආයතනය සමඟ එක්ව කොළඹ දී පැවැත්වන ලද අතර ඒ සඳහා දේශිය වෙළෙඳපොළේ මෙරට වෙළෙඳ සන්නාම ප්‍රවර්ධනය කිරීම සඳහා දේශන පැවැත්වීම සඳහා පැමිණි දේශකයන් ඇතුළු 130 දෙනෙක් සහභාගි වූහ. ඔවුන් සඳහා රම්බොඩගල්ල මත්ස්‍ය අභිජනන හා පුහුණු

මධ්‍යස්ථානයට ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කරන ලදී. මෙම අවස්ථාවට සහභාගී වූ කීර්තිමත් ජාත්‍යන්තර කථිකයින් 16 දෙනෙක් විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ වෙළෙඳ හා තාක්ෂණ අභියෝග, මුහුදු සහ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය යන දෙවර්ගයට ආවේණික සංවර්ධන හා නවෝත්පාදන ක්‍රම පිළිබඳ වැදගත් අංගයන් ආවරණය කරමින් දේශන පවත්වන ලදි. මෙහි දී විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ වත්මන් හා බලාත්මක වන නීති සහ රෙගුලාසි, පාරිසරික ගැටළු, සහතික කිරීම, වැළැක්වීම සහ රෝග පාලනය පිළිබඳ දැවෙන ගෝලීය ගැටළු කිහිපයක් ද සාකච්ඡා කරන ලදි.

### 2017 පෙබරවාරි 26 සිට මාර්තු 02 දක්වා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි පැවැති Gulf Food අන්තර්ජාතික ප්‍රදර්ශනය

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2017 පෙබරවාරි මස 26 සිට මාර්තු මස 02 දක්වා ඩුබායි හි පැවැති Gulf Food ප්‍රදර්ශනය සඳහා ආහාර හා පාන ක්ෂේත්‍රයේ නියැළි අපනයනකරුවන් 23ක් සහ නිරීක්ෂකයින් 2 දෙනෙක් ඇතුළත් ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලදී. මෙහි දී ඇසුරුම් කරණය සහ මෝස්තර ඇතුළුව ප්‍රදර්ශනය කරන ලද නව තාක්ෂණයන් පිළිබඳ ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට දැක බලා ගැනීමේ අවස්ථාව හිමි විය. එමෙන්ම රුසියාව සහ ඝානාව තුළ බෙදාහරින්නන් හඳුනා ගැනීමට ලැබුණු අතර ශ්‍රී ලංකා රතු සහල් සුපිරි වෙළඳසැල් ජාලයට හඳුන්වා දීමට ද අවස්ථාව හිමි විය. පසුගිය මාස 6 තුළ දී ඩොලර් මිලියන 24.7 ක වටිනාකමින් යුතු ඇණවුම් ලැබුණු අතර සහ ඩොලර් මිලියන 7.5 ක් වටිනා ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී.

### 2017 මාර්තු මස 07 සිට 10 දක්වා ජපානයේ චිබා හි දී පැවැති Foodex අන්තර්ජාතික ප්‍රදර්ශනය

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක් ව ජපාන ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහයෝගිතාවෙන් 2017 මාර්තු 07 සිට 10 දින දක්වා ජපානයේ Makuhari Messe හි දී පැවැත්වූ FOODEX 2017 ප්‍රදර්ශනය සඳහා පිරිසිදු පොල් තෙල් නිෂ්පාදනයේ නිරත අපනයනකරුවන් 8 දෙනෙකු ගෙන් සමන්විත ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලදී. පිරිසිදු පොල් තෙල් සඳහා ශ්‍රී ලංකාවට අහිමි වූ ජපාන වෙළෙඳපොළ නැවත ලබාගැනීමට සහ ශ්‍රී ලංකාවේ පිරිසිදු පොල් තෙල් පිළිබඳ ගැනුම්කරුවන්ට ඒත්තු ගැන්වීමට මෙහි දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු විය. වෙළෙඳ ඇණවුම් 16 ක් සාකච්ඡා මට්ටමේ පවතී.

## FACET 2017

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා දෙවන පෙළ අපනයනකරුවන් ගොඩනැගීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වෙළෙඳ මණ්ඩපයක් 2017 දී Facets ශ්‍රී ලංකා ප්‍රදර්ශනය සඳහා සංවිධානය කරන ලදී. මෙහි දී ස්වර්ණාභරණ නිෂ්පාදකයන් 15 ක් සහ නිර්මාණකරුවන් 8 ක් තම නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලදී. ප්‍රදර්ශන පරිශ්‍රයේ දී නිෂ්පාදන අලෙවියෙන් රු. මිලියන 2.0 ක් ලැබුණු අතර රු. මිලියන 0.6 ක් වටිනා ඇණවුම් හිමි විය. රු. මිලියන 1.5 වටිනා ඇණවුම් පිළිබඳ ව ඇමරිකානු එක්සත් ජනපදය හා සාකච්ඡා මට්ටමේ පවතී.

### 2017 පෙබරවාරි මස 03 සිට 05 දක්වා කොළඹ දී පැවති පාවහන් හා සම් භාණ්ඩ ප්‍රදර්ශනය

රුපියල් මිලියන දෙකක අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය දායකත්වයෙන්, ශ්‍රී ලංකා පාවහන් සහ සම් භාණ්ඩ නිෂ්පාදකයන්ගේ සංගමය (SLFLPMA), කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය සහ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය විසින් 9 වන පාවහන් හා සම් භාණ්ඩ ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී. මෙහි දී ශ්‍රී ලංකා සමාගම් එක සිය එකක්(101) සහ ඉන්දියානු සමාගම් 35 ක් ඇතුළු ප්‍රදර්ශන කුටි 231 ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කෙරිණ. එමෙන්ම විශේෂ නිර්මාණ සඳහා වෙළෙඳ මණ්ඩපයක් සංවිධානය කළේ ය. රු. මිලියන 2.5 ක් වටිනා ඇණවුම් හිමි වූ අතර රු. මිලියන 1.0 වටිනා ඇණවුම් පිළිබඳ ව සාකච්ඡා මට්ටමේ පවතී.

**ශ්‍රී ලංකාවට පැමිණි වෙළඳ දූත පිරිස්**

**කැනඩාව**

2017 මාර්තු මස 13 වැනි දින පැවති කැනඩා - ශ්‍රී ලංකා ව්‍යාපාරික සමුළුව හා සමගාමී ව B2B රැස්වීම් වැඩසටහනක් සංවිධානය කරන ලදී. කැනේඩියානු ව්‍යාපාරිකයින් 28 ක් සමඟ B2B රැස්වීම් පැවැත්වීම සඳහා ශ්‍රී ලාංකික සමාගම් 75 ක් පමණ සහභාගි විය. කැනේඩියානු ශ්‍රී ලංකා ව්‍යාපාරික සමුළුව මගින් ශ්‍රී ලංකාව තුළ පවත් නා වෙළඳ හා ආයෝජන අවස්ථා පිළිබඳ ව කැනේඩියානු ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කරන ලදී. එමෙන්ම මෙහි දී කැනඩාවේ ව්‍යාපාරිකයෝ ධීවර නිෂ්පාදන, පලතුරු හා එළවළු සඳහා සිසිලන යන්ත්‍රයක් සඳහා ආයෝජනය කිරීමට කැමැත්ත පළ කර සිටිය හ.

**ස්වීඩනය**

ශ්‍රී ලංකාව සහ IKEA අතර වෙළෙඳ අවස්ථා සොයා බැලීම සඳහා පෙබරවාරි 20 වන දින IKEA ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට පැමිණියේ ය. රබර්, ගෘහ භාණ්ඩ, කොහු නිෂ්පාදන සහ අත්කම් නිෂ්පාදන වැනි ක්ෂේත්‍රයන් හි නිරත සමාගම් 29 ක් IKEA නියෝජිත කණ්ඩායම සමඟ ව්‍යාපාර රැස්වීම් පැවැත්වීය. සමාගම් දෙකක් දැනටමත් IKEA සමඟ ව්‍යාපාරික මට්ටමේ සාකච්ඡා ආරම්භ කර ඇති අතර, එම කර්මාන්තශාලා සහ රබර් වගාවන් ආරම්භ කර ඇති කර්මාන්තශාලා නැරඹීම සඳහා සහභාගී විය.

**ඕස්ට්‍රේලියාව**

2017 මාර්තු මස 29 වන දින ශ්‍රී ලාංකීය කුළු බඩු, පොල් තෙල් නිෂ්පාදන සමාගම් සඳහා ශ්‍රී ලංකාවේ සංචාරය කළ ඕස්ට්‍රේලියාවේ M/s පැසිෆික් කොමොඩිටීස් සමූහ ව්‍යාපාරය සමඟ B2B හමුවීමේ වැඩසටහන සංවිධානය කරන ලදී. මෙහි දී ඕස්ට්‍රේලියානු සමාගම විසින් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලාංකීය සමාගම් 2 ක් තෝරා ගන්නා ලදි.

**සීෂෙල්ස්**

2017 වසරේ සිට පෙබරවාරි 3 වැනිදා දක්වා ශ්‍රී ලංකාවේ නැවුම් එළවළු සහ පලතුරු සමාගම් සඳහා සීෂෙල්ස් ට්‍රැවල්ස් සමාගම සමග B2B රැස්වීම් වැඩසටහනක් සංවිධානය කරන ලදී. සීෂෙල්ස් ට්‍රැවල්ස් සමාගම විසින් තවදුරටත් සාකච්ඡා සඳහා ශ්‍රී ලාංකික සමාගම් හතරක් තෝරා ඇති අතර ඔවුන් සීෂෙල්ස් වෙළඳ සමාගම් වෙත නියැදි යවන ලදි.

**පෝලන්තය**

2017 පෙබරවාරි 21 වන දින පෝලන්තයේ රොබට්ස් හැග්රිඩ් සමඟ ශ්‍රී ලාංකික මල් වගා කර්මාන්ත, සත්ත්ව නිෂ්පාදන හා කොහු නිෂ්පාදන සමාගම් සමඟ B2B රැස්වීම් වැඩසටහනක් සංවිධානය කරන ලදී.

**ඕමාන්**

2017 මැයි මස 15 - 18 දිනවල ඕමාන සමාගම් 05 ක් සහ ශ්‍රී ලාංකික සමාගම් 45 ක් අතර B2B රැස්වීමේ වැඩසටහන් සංවිධානය කරන ලදි. ශ්‍රී ලංකා සමාගම් 8 ක් සමඟ ඇණවුම් 17 ක් සාකච්ඡා මට්ටමේ පවතින අතර ඕමාන් ගැනුම්කරුවන් සමඟ ශ්‍රී ලංකා සමාගම් දෙකක් දැනටමත් ව්‍යාපාර ආරම්භ කර තිබේ.

**වෙළඳපළ සංවර්ධන කටයුතු සඳහා අපනයනකරුවන්ගේ ප්‍රයත්නයන්ට සහන සැලසීමේ සහන යෝජනා ක්‍රමය**

වෙළඳපළ පර්යේෂණ/ සමීක්ෂණ සිදු කිරීම, නිෂ්පාදන වැඩිදියුණු කිරීම/ හැඩ ගැස්වීම/ සාම්පල සහ අපනයන ඇසුරුම් කරණය, වෙළඳ ප්‍රදර්ශන/ වෙළඳ දූත මණ්ඩල සඳහා සහභාගී වීම යනා දී කාර්යයන් ට සහන සැලසීමේ යෝජනා ක්‍රමය අපනයන සංවර්ධන මණ්ඩලය ප්‍රති ව්‍යුහගත කර ඇත. මේ වන විට සමාගම් 24කට සහාය ලබා දී තිබේ.

## 05. යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම යටතේ චීන වෙළඳපොළ සංවර්ධනය සඳහා උපාය මාර්ග

### 2017 සැප්තැම්බර් 12 සිට 15 දක්වා චීනයේ Nanning හි දී පැවති චීනයේ ආසියානු එක්ස් පෝ ප්‍රදර්ශනය

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මැණික් හා ස්වර්ණාභරණ, තේ, රබර් නිෂ්පාදන සහ හස්ත කර්මාන්ත අංශයේ ශ්‍රී ලාංකේය සමාගම් 30 දෙනෙකු ගෙන් සමන්විත ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලදී. ප්‍රදර්ශනයට පෙර දින වෙළඳ, සංචාරක හා ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ව්‍යාපාරික සංසදය පවත්වන ලද අතර එයට චීන ව්‍යවසායකයින් 300 ක් සහභාගී වූහ. මෙහි දී චීන ව්‍යවසායකයින්, ශ්‍රී ලංකා තේ, මැණික්, ප්‍රතිචක්‍රීකරණ කඩදාසි, පොල් මද ආශ්‍රිත නිෂ්පාදන සහ බතික් නිෂ්පාදන පිළිබඳ ව දැනුවත් කිරීම සිදු කෙරිණ. වෙළඳ විමසීම් 224 ක් සහ ඇමෙරිකානු ඩොලර් 80,000 ක ස්ථිර වෙළෙඳ ඇණවුම් ලැබිණ. ඊට අමතරව අමෙරිකන් ඩොලර් 50,000 ක් වටිනා ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී.

### 2017 ඔක්තෝබර් 10 සිට 13 දක්වා චීනයේ ගුවැන් ෂූ හී දී පැවති චීන අන්තර්ජාතික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රදර්ශනය

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අගය 14 වන චීන අන්තර්ජාතික කුඩා හා මධ්‍ය පරිමාණ ප්‍රදර්ශනය සඳහා එකතු කළ තේ, පාවහන්, ඇඟලුම්, කුළු බඩු, පොල් ආශ්‍රිත නිෂ්පාදන, සැකසූ ආහාර, මැණික් සහ ස්වර්ණාභරණ සහ අත් යන්ත්‍ර නිෂ්පාදන නිපදවන ශ්‍රී ලාංකේය සමාගම් 25 කින් සමන්විත ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලදී. මේ සඳහා සහභාගි වූ ශ්‍රී ලාංකේය සමාගම් වලට ව්‍යාපාර විමසීම් 10,000 ක් පමණ ලැබී ඇත. චීනයේ, ශ්‍රී ලාංකේය කුළු බඩු හා කොහු නිෂ්පාදන හවුල් ව්‍යාපාර සඳහා නියෝජිතයන් පත් කිරීම සඳහා සමාගම් දෙකක් පැවැත් වූ සාකච්ඡා සාර්ථක විය. තල් ආශ්‍රිත නිෂ්පාදන, වෙල්වට් චිත්‍ර, නිල් මැණික්, ඖෂධ තේ, කළු තේ ආදිය සඳහා ස්ථිර වෙළෙඳ ඇණවුම් ලැබිණ. ප්‍රදර්ශනයේ දී තල් ආශ්‍රිත නව නිපැයුම් හා නවෝත්පාදනයන් ඉදිරිපත් කරන ලදි. මෙහි දී ඇමෙරිකානු ඩොලර් 13,100 ක වටිනාකමකින් යුත් වෙළෙඳ ඇණවුම් ලැබිණ.

### 2017 දෙසැම්බර් 08 සිට 10 දක්වා චීනයේ ෂැංහයි හී දී පැවති චීන Belt and Road එක්ස් පෝ 2017

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මැණික් හා ස්වර්ණාභරණ, තේ, රබර් නිෂ්පාදන සහ හස්ත කර්මාන්ත අංශයෙන් ශ්‍රී ලාංකේය සමාගම් 7 කින් සමන්විත ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලදී. මීට අමතරව B2B රැස්වීම් 33 ක් සංවිධානය කරන ලදි. මෙහි දී ශ්‍රී ලංකා වෙළෙඳ මණ්ඩපයට 27,773 දෙනෙක් පැමිණ අතර ඇමෙරිකානු ඩොලර් 30,000 කට වැඩි වටිනාකමකින් යුත් ස්ථිර වෙළෙඳ ඇණවුම් ලැබිණ.. තවද ඇමෙරිකානු ඩොලර් 2,006,500 ක් වටිනා ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතින අතර, ධනාත්මක වෙළෙඳ විමසීම් දෙකක් ද ලැබී ඇත. ප්‍රදර්ශන පරිශ්‍රයේ දී නිෂ්පාදන අලෙවියෙන් ඇමෙරිකානු ඩොලර් 28,800 ක් ලැබුණු අතර ඒකාබද්ධ හවුල් ව්‍යාපාර දෙකක් සාකච්ඡා කෙරෙමින් පවතී.

## 06. GSP+ සහනය උපයෝගී කර ගනිමින් යුරෝපා සංගමය ට සිදු කෙරෙන අපනයන සංවර්ධනය

### 2017 අප්‍රේල් 25 සිට 27 දක්වා බෙල්ජියමේ බ්‍රසල්ස් හි දී පැවැති මුහුදු ආහාර වෙළඳ ප්‍රදර්ශනය (Seafood Expo Global 2017)

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් යුරෝපා හවුලේ මත්ස්‍ය තහනම (IUU) ඉවත් කිරීමෙන් පසු මෙම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා සමාගම් 8 කින් සමන්විත ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලදී. ප්‍රදර්ශනය හා සමගාමීව, මාධ්‍ය නිවේදනයක් සිදු කරන ලද අතර එහි දී ටූනා සහ බිල් ෆිෂ් මත්ස්‍ය වර්ග සඳහා ශ්‍රී ලංකාවේ ආරම්භ කළ ප්‍රවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ ද නිවේදනය කරන ලදි. ඇමෙරිකානු ඩොලර් 400,000 ක ස්ථිර වෙළෙඳ ඇණවුම් ලැබිණ. ඊට අමතරව අමෙරිකන් ඩොලර් 458,000 ක් වටිනා ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී.

### 2017 අප්‍රේල් 7 සිට 11 දක්වා ජර්මනියේ කොලෝන් හි දී පැවැති Anuga 2017 ආහාර සහ පාන වෙළඳ ප්‍රදර්ශනය

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙම ප්‍රදර්ශනය සඳහා නව වෙළෙඳ සමාගම් 06 ක් ඇතුළු ශ්‍රී ලංකා සමාගම් 20 කින් සමන්විත ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලදී. මෙහි දී ඇමෙරිකානු ඩොලර් 1,140,000 ක වටිනාකමකින් යුත් වෙළෙඳ ඇණවුම් ලැබුණු අතර ධනාත්මක වෙළෙඳ විමසීම් 257 ක් ලැබී තිබිණ. මේ අතර, ප්‍රදර්ශනයට සහභාගි වූ ශ්‍රී ලාංකේය අපනයනකරුවන්ට නව ගැණුම් කරුවන්, නව වෙළෙඳපොළ අවස්ථා, නව නිෂ්පාදන හඳුන්වා දීම මෙන් ම නව හවුල් ව්‍යාපාර අවස්ථා වන් වලට යොමු වීමේ අවස්ථාව ද මෙහි දී හිමි විය. තවද "Cocoferc" වෙළඳ නාමය සහභාගි වූ එක් සමාගමක් විසින් දියත් කරන ලදී.

### 2017 සැප්තැම්බර් 18 සිට 21 දක්වා ප්‍රංශයේ පැරිසියේ හි දී පැවැති Apparel Sourcing Paris වෙළඳ ප්‍රදර්ශනය

GSP+ සහනය නැවත හිමි වීමත් සමඟ ම ශ්‍රී ලංකාවෙන් ඇඟලුම් මිල දී ගැනීමට එක්සත් රාජධානියේ "ඩෙබන්හම්ස්" සහ ස්පාඤ්ඤයේ "සාරා" මහත් උනන්දුවක් දැක්වීය. විලාසිතා ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වන ප්‍රංශය විසින් ශ්‍රී ලංකාව විශ්වසනීය සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස පිළි ගැනීමෙන් යුරෝපීය සංගමයේ ශ්‍රී ලංකාවට ඇති තත්වය මනාව පිළිබිඹු වේ. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඇඟලුම් නිෂ්පාදකයින් 08 දෙනෙකුගේ සහභාගීත්වය සංවිධානය කරන ලද අතර එහි දී ඔවුන් සාර්ථක ප්‍රතිඵල කිහිපයක් ම අත් කර ගැනීමට සමත් විය. ස්පාඤ්ඤය සඳහා ඇමරිකන් ඩොලර් මිලියන 1.4 ක් වටිනා කාන්තා ඇඟලුම් පිළිබඳ ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී. නෙදර්ලන්ත වෙළෙඳ ගැණුම් කරුවන් පිරිසක් ශ්‍රී ලංකා ඇඟලුම් කර්මාන්ත ශාලා නැරඹීම ට පැමිණි අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2018 ජනවාරි මාසයේ දී ඇමරිකානු ඩොලර් 70,000 / - ක ඇණවුම් සැපයීම සඳහා නිෂ්පාදනය කටයුතු ආරම්භ කළ අතර "Aditi" වෙළෙඳ සන්නම ප්‍රවර්ධනය සඳහා සහය වන ලදි.

ප්‍රදර්ශනය හා සමගාමීව සහභාගී වූ සමාගම් විසින් ශ්‍රී ලාංකේය හැකියා වන් ප්‍රදර්ශනය කරමින් අත් යන්ත්‍ර සහ බතික් ආශ්‍රිත නිර්මාණාත්මක ඇඟලුම් ඉදිරිපත් කිරීම සඳහා "Sri Lanka Catwalk" සංවිධානය කරන ලදී. මෙහි දී සිලෝන් Activewear (ලෝව් සරොන්), බුද්ධි බතික්ස් සහ මෙරාකි ශ්‍රී ලාංකේය නිෂ්පාදන කෙරෙහි විදේශීය ගැනුම්කරුවන් ගේ ඉහළ වැඩි අවධානයක් යොමු කරන ලදි. ප්‍රථම වරට පැවැත්වූ ශ්‍රී ලාංකේය නිෂ්පාදන ප්‍රදර්ශනය අති සාර්ථක විය.

**2017 ජුනි මස 13 සිට 16 දක්වා රබර් නිෂ්පාදන අංශය සඳහා එක්සත් රාජධානියේ පැවැත් වූ තාක්ෂණික පුහුණු වැඩසටහන**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සහාය ඇති ව 2017 ජුනි මස 13 සිට 16 දින දක්වා එක්සත් රාජධානියේ ටුන් අබ්දුල් රසීක් පර්යේෂණ මධ්‍යස්ථානයේ දී (TARRC) රබර් නිෂ්පාදන අංශය සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ නිලධාරියෙකු ඇතුළුව රබර් නිෂ්පාදන නිපදවන සහ අපනයනය කරන ප්‍රමුඛ සමාගම් 11ක් මේ සඳහා සහභාගි වූ අතර ඔවුන්ට තාප ස්ථායී ඉලාස්ටොමර්ස්/ වල්කනිස්ටට්ස්, නැනෝ තාක්ෂණ යෙදුම්, ටයර් පරීක්ෂා කිරීමේ උසස් ක්‍රම, ඉංජිනේරු සැලසුම් ඇතුළුව ගණිතමය ආකෘති පිළිබඳ දැනුම සහ අවබෝධය ලබා ගැනීමට හැකි විය.





**නොවැම්බර් 21 සිට 24 දක්වා ICT / BPM අංශය සඳහා එක්සත් රාජධානියේ පැවැත් වූ B2B වැඩසටහන සහ ජාල කරණ රැස්වීම**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එක්සත් රාජධානියට අපනයනය වැඩි කිරීම සඳහා B2B සහ Networking වැඩසටහන් සඳහා ශ්‍රී ලාංකේය සහභාගිත්වය සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සමාගම් 10ක් මෙම අවස්ථාවට සහභාගී වූ අතර ඔවුන්ට නව ව්‍යාපාරික සබඳතා(ආසන්න වශයෙන් 12) නිර්මාණය කිරීමට ද හැකි වූ අතර එම සමාගම් එක්සත් රාජධානිය සමඟ ගිවිසුම් සාකච්ඡා මට්ටමේ පවතී.

**07. ආසියානු වෙළෙඳ පල ට ප්‍රවේශය (නිදහස් වෙළෙඳ ගිවිසුම් යටතේ ජපානයට සහ දකුණු ආසියාවට)**

**2017 මාර්තු මස 7 සිට 10 දක්වා ජපානයේ දී පැවති Foodex 2017 ආහාර සහ පාන වෙළඳ ප්‍රදර්ශනය**

උසස් තත්ත්වයේ පිරිසිදු පොල් තෙල් (VCO) පිළිබඳ ජපන් ආනයනකරුවන් දැනුවත් කිරීම සහ අහිමි වී ගිය ජපාන වෙළඳපොළ නැවත ලබා ගැනීමේ අරමුණින් මෙම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලාංකීය සමාගම් 6 කගෙන් සමන්විත ශ්‍රී ලංකා සහභාගීත්වය සංවිධානය කරන ලදි. පිරිසිදු පොල් තෙල් (VCO) ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රදර්ශන භූමියේ ප්‍රචාරක වැඩමුළුවක් පවත්වන ලද අතර ඒ සඳහා විදේශිකයන් 35 දෙනෙකු සහභාගී විය. මෙහි දී ඇමෙරිකානු ඩොලර් 261,883 ක ස්ථිර වෙළෙඳ ඇණවුම් ලැබුණු අතර ඊට අමතරව ජපානය, චීනය, ඕස්ට්‍රේලියාව, මැලේසියාව හා තුර්කිය යනාදී රටවලින් ඇමරිකන් ඩොලර් 71,678 ක් වටිනා ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී.

**2017 ඔක්තෝබර් 11 සිට 13 දක්වා ජපානයේ ටෝකියෝවේ දී පැවති IFEX / Gardex වෙළඳ ප්‍රදර්ශනය**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙම ප්‍රදර්ශනය සඳහා වෙළෙඳ සමාගම් 07 කින් සමන්විත ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලදී. මෙහි දී ඇමෙරිකානු ඩොලර් 94,614 ක ස්ථිර වෙළෙඳ ඇණවුම් ලැබුණු අතර ඊට අමතරව ඇමරිකන් ඩොලර් 55,000 ක් වටිනා වෙළෙඳ ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී. මීට අමතරව, ධනාත්මක වෙළෙඳ විමසුම් 40 ක් ලැබී ඇත. මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගී වීමෙන් "සහල්" නව නිෂ්පාදනයක් ලෙස ජපන් වෙළඳපළට හඳුන්වා දීමත් ඒ සඳහා ජපානය තුල ඉහළ ඉල්ලුමක් ඇති කිරීමටත් හැකි විය. එමෙන්ම මෙහි දී ශ්‍රී ලාංකේය සමාගම් වලට අනෙකුත් තරඟ කාරි රටවල් භාවිතා කළ අලෙවිකරණ ක්‍රමෝපායින් පිළිබඳ දැනුවත් වීමේ අවස්ථාව හිමි විය. ජපාන කෘෂිකර්ම සංවිධානය (JA) විසින් 2016 දී ශ්‍රී ලංකාවේ වෙළෙඳ සමාගම් විසින් ලබා දුන් නිෂ්පාදන නියැදි පිළිබඳ තත්ත්වය සාකච්ඡා කිරීම සඳහා ප්‍රදර්ශන භූමියේ දී රැස්වීමක් පැවැත් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් නැවත ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වීමෙන් අනතුරුව කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන සමාගම් දෙකක් තෝරා ගෙන තිබේ. නිෂ්පාදන නියැදි වල ප්‍රධානතම ගැටලුව වන්නේ වල් අපද්‍රව්‍ය බව ඔවුන් සඳහන් කරන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් RHP සහතිකය (වල් අපද්‍රව්‍ය වලින් තොර) යටතේ නිෂ්පාදන අපනයනය කරන එක සමාගමක් හඳුන්වා දෙන ලදි. ජපාන කෘෂිකර්ම සංවිධානය (JA) විසින් දෙසැම්බර් මස එක් සමාගමකින් ඇමෙරිකානු ඩොලර් 2,500 ක වටිනාකමකින් යුතු කොකෝ පීට් අඩි 40 ක කන්ටේනරයක් පළමු අත්හදා බැලීමක් ලෙස මිල දී ගන්නා ලදි.

**2017 අප්‍රේල් 25 සිට 30 දක්වා දකුණු කොරියාවේ දී පැවති IHK වෙළඳ ප්‍රදර්ශනය**

මල් වගාව හා මල් වගාව ආශ්‍රිත කොහු අපනයන වැඩි කිරීම සහ පවත්නා ගැණුම් කරුවන් සමඟ සම්බන්ධතා වැඩි දියුණු කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එක් මල් වගා සමාගමක් සහ කොකෝ පීට් නිෂ්පාදන සමාගම් දෙකක් වෙළෙඳ ප්‍රදර්ශනයට සහභාගි කර විය. ප්‍රදර්ශනය හා සමගාමී ව කොරියානු සාධාරණ වෙළෙඳ අධිකාරිය විසින් සංවිධානය කරන ලද චාරිකා මගින් කොරියානු තාක්ෂණය පිළිබඳ එක් සමාගමකට පළපුරුද්දක් ලැබුණු අතර මල් වෙන්දේසි කිරීමේ මධ්‍යස්ථානය වෙත යෑමට අවස්ථාව හිමි විය. මෙම ප්‍රදර්ශනය තුළින් කොරියානු වෙළෙඳපොළ විසින් ඉල්ලා සිටි මල් ප්‍රභේද ප්‍රචාරණය කිරීම එක් ශ්‍රී ලංකා සමාගමක් විසින් ආරම්භ කරන ලදි. එක් සමාගම විසින් කොහු ලෝගු සඳහා ඇ.ඩො. 8,274 ක වටිනාකමකින් යුතු ස්ථිර වෙළෙඳ ඇණවුම් සපයන ලදි. වෙනත් සමාගමක් විසින් කොරියානු ගැනුම්කරු විසින් කරන ලද ඉල්ලීම ඉලක්ක කර ගනිමින් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කර ඇති අතර කොකෝ පීට් නිෂ්පාදන සඳහා ඇමෙරිකානු ඩොලර් 12,500 ක වටිනාකමකින් යුතු මාසික වෙළෙඳ ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී.

**08. නිදහස් වෙළෙඳ ගිවිසුම් සහ ආර්ථික සහයෝගිතා ගිවිසුම් හරහා වෙළඳපොළ ප්‍රවේශය**

**2017 ජනවාරි 19 සිට 20 දක්වා ඉන්දියාවේ චෙන්නායි හි පැවති රබර් එක්ස් පෝ 2017 වෙළඳ ප්‍රදර්ශනය**

ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන ඉන්දියානු වෙළෙඳපොළ තුළ ප්‍රවර්ධනය කිරීමට සහ නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ ඇති අවස්ථා පිළිබඳ ව සොයා බැලීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඉන්දියාවේ රබර් එක්ස්පෝ 2017 ප්‍රදර්ශනය සඳහා වෙළෙඳ සමාගම් 06 කින් සමන්විත ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලදී. ශ්‍රී ලාංකීය වෙළෙඳ මණ්ඩපයට නරඹන්නන් රාශියක් පැමිණි අතර වෙළෙඳ විමසුම් 250-300 ක් ලැබී තිබිණ. ශ්‍රී ලංකා ටයර් සඳහා චෙන්නායි හි එක් නව බෙදාහරින සමාගමක් සොයාගත් අතර "ORION" නව වෙළඳ නාමය යටතේ එම ටයර් ප්‍රවර්ධනය කරන ලදී. මෙහි දී තවත් සමාගමක් විසින් රබර් ආශ්‍රිතව නිපදවන තෙල් හා රසායන ද්‍රව්‍ය සඳහා චෙන්නායි නව සැපයුම්කරුවෙකු සොයා ගැනීමට සමත් විය. එමෙන්ම ඇමෙරිකානු ඩොලර් 118,230 ක් වටිනා ස්ථිර වෙළෙඳ ඇණවුම් ලැබුණු අතර ඇමෙරිකානු ඩොලර් 15,000 ක වටිනාකමකින් යුතු වෙළෙඳ ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී.

**2017 මැයි 10 සිට 12 දක්වා ජපානයේ ටෝකියෝ නුවර දී පැවති ජපානයේ තොරතුරු තාක්ෂණ සතිය**

ජපානයේ තොරතුරු තාක්ෂණ සතිය ප්‍රදර්ශන පරිශ්‍රයේ "ටෝකියෝ බිග් ස්මයිට්" හි තම නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමෙන් ප්‍රධාන ශ්‍රී ලාංකේය තොරතුරු තාක්ෂණ සමාගම් 8 ක් සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීමට සමත් විය. මෙහි දී එක් ශ්‍රී ලාංකේය සමාගමක් කොන්ත්‍රාත් දෙකකට අත්සන් තබන ලද අතර තවත් ඇමෙරිකානු ඩොලර් 25,000 ක වටිනාකමකින් යුත් කොන්ත්‍රාත් එකක් පිළිබඳ අවධානය යොමු කර ඇත. තවත් සමාගමකට මාස දෙකකට වරක් ඇමෙරිකානු ඩොලර් 200,000 ක වටිනාකමකින් යුත් වෙළෙඳ ඇණවුම් ජපාන ගැණුම් කරුවන් දෙදෙනෙකු විසින් ලබා දී තිබේ. එපමණක් නොව, ශ්‍රී ලාංකේය තොරතුරු තාක්ෂණ සමාගම් විසින් IoT නිෂ්පාදන, ව්‍යවසාය සම්පත් සැලසුම් කරණය (ERP) සහ මූල්‍ය විසඳුම් සඳහා ජපාන ගැණුම් කරුවන් සමඟ කොන්ත්‍රාත්තු වලට අනුකූලව කටයුතු කිරීම ආරම්භ කරන ලදි. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලාංකේය තොරතුරු සන්නිවේදන තාක්ෂණ සමාගම් පහක් සඳහා ජපානයේ උපදේශන සමාගමක සහාය ඇති ව ජපානයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වෙළෙඳපොළේ ඇති අවස්ථා වන් ගවේෂණය කිරීම සඳහා වැඩසටහනක් සංවිධානය කර ඇත. එක් ශ්‍රී ලාංකේය තොරතුරු සන්නිවේදන තාක්ෂණ සමාගමක් ජපානයේ ගෝලීය තොරතුරු උද්‍යානයේ දී අනුබද්ධිත සමාගමක (එක්සත් ජනපද ඩොලර් 50,000) ආයෝජනය කර ඇති අතර තවත් කොන්ත්‍රාත්තු දෙකක් අත්සන් කර ඇති අතරම තවත් සමාගම් හතරක් මේ සඳහා පිවිසී ඇත. ජපාන යෙන් 735,000 ක් වටිනාකමකින් යුතු ව්‍යාපාර මේ වන විට ක්‍රියාත්මක තත්වයේ පවතී.

**09) ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා ගෝලීය වෙළඳපළේ සන්නම් කරණය**

**2017 අගෝස්තු 8 සිට 12 දක්වා ඩුබායි හි දී පැවති GITEX තාක්ෂණ සතිය**

මැදපෙරදිග හා අප්‍රිකාව වෙත අපනයනය වැඩි කිරීම අරමුණු කර ගනිමින් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙම ප්‍රදර්ශනය සඳහා වෙළෙඳ සමාගම් 08 කින් සමන්විත ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලද අතර ව්‍යාපාර ආරම්භයන් ප්‍රදර්ශනය කරන මණ්ඩපය තුල තවත් ආරම්භක ව්‍යාපාර 4 කට ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාව උදා කර දෙන ලදි. මෙහි දී සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කැනඩාව, එක්සත් රාජධානිය, ජපානය, ඉන්දියාව, පලස්තීනය, ඕස්ට්‍රේලියාව හා ඕමාන් යන රටවල් වලින් සාර්ථක කර ගත හැකි වෙළෙඳ විමසීම් රාශියක් ලැබිණ. මීට අමතරව ඇමෙරිකානු ඩොලර් 1,088,000 ක් වටිනා ස්ථිර වෙළෙඳ ඇණවුම් ලැබුණු අතර තවත් වෙළෙඳ ඇණවුම් 100 කට වඩා වැඩි සංඛ්‍යාවක් සාකච්ඡා මට්ටමේ පවතී.

**2017 පෙබරවාරි 6 සිට 10 දක්වා රුසියාවේ මොස්කව් හි පැවති PRODEXPO 2017 වෙළඳ ප්‍රදර්ශනය**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙම ප්‍රදර්ශනය සඳහා වෙළෙඳ සමාගම් 10 කින් සමන්විත ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලද අතර මෙම ප්‍රදර්ශනය තුලින් වෙළෙඳ සම්බන්ධතා 212 ක් පමණ ඇති කර ගැනීමට හැකි විය. ප්‍රදර්ශනය සඳහා සහභාගි අපනයනකරුවන් 10 දෙනා විසින් 2017 වර්ෂය තුළ රුසියාවට ඇමෙරිකානු ඩොලර් මිලියන 3.1 ක් වටිනා අපනයනයෙන් සිදු කළහ.

**2017 අප්‍රේල් 30 සිට මැයි 4 දක්වා කැනඩාවේ පැවති SIAL 2017 වෙළඳ ප්‍රදර්ශනය**

2015 සිට 2018 දක්වා වසර 4 ක කාලයක් සඳහා කැනඩාවේ වෙළඳ පහසුකම් කාර්යාලය (TFO) සමග අපනයන සංවර්ධන මණ්ඩලය ගිවිසුමක් අත්සන් කර ඇති අතර කැනඩාව සඳහා ශ්‍රී ලංකාවෙන් සිදු කෙරෙන අපනයන සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස SIAL කැනඩා 2017 වෙළඳ ප්‍රදර්ශනයට සහ B2B වැඩසටහනට ශ්‍රී ලාංකේය සහභාගිත්වය අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී. මෙම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලාංකේය වෙළෙඳ සමාගම් 10 ක් සහභාගී වූ අතර ඔවුන්ට නිෂ්පාදන තත්වයන්, ඇසුරුම්කරණය සහ ලේබල් කිරීම පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අවස්ථාව හිමි විය. ඒ අනුව සමාගම් දෙකට තම නිෂ්පාදන විධි කාර්යක්ෂම කර

ගැනීමට හැකි විය. සහභාගීත්වයෙන් ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපාරික සම්බන්ධතා 170 ක් පමණ ඇති කර ගැනීමට ශ්‍රී ලාංකේය අපනයනකරුවන් සමත් විය.මෙම අවස්ථාවට සමගාමීව ප්‍රදර්ශනයට සහභාගී වූ ශ්‍රී ලාංකේය අපනයනකරුවන්ට කැනඩාවේ සිල්ලර වෙළඳ පොල සංචාරයකට මෙන් ම දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් හා B2B රැස්වීම්වලට සහභාගි වීමට අවස්ථාව කැනඩාවේ වෙළඳ පහසුකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලදී. ඇමරිකානු ඩොලර් මිලියන 1.50 වටිනා නව අපනයන ඉදිරි වසර තුල දී ඇති වේ යැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම ඇමෙරිකානු ඩොලර් 150,000 ක් වටිනා ස්ථිර වෙළෙඳ ඇණවුම් ලැබුණු අතර ඇමෙරිකානු ඩොලර් 300,000 ක වටිනාකමකින් යුතු වෙළෙඳ ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී.

**2017 නොවැම්බර් 7 සිට 9 දක්වා පකිස්තානයේ කරච්චි හි පැවති පකිස්ථාන එක්ස්පෝ**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පකිස්තානයේ කරච්චි හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය සමඟ එක්ව මෙම ප්‍රදර්ශනය සඳහා වෙළෙඳ සමාගම් 14 කින් සමන්විත ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලද අතර ඔවුන් රසායනික ද්‍රව්‍ය (එන්සයිම සහ අතිරේක රසායන ද්‍රව්‍ය) , ඉදි කිරීම් සඳහා අවශ්‍ය බිම ආලේපන, අගය එකතු කළ අඟුරු නිෂ්පාදන, මැටි පුවරු, ප්ලාස්ටික් සහ පිඟන් භාණ්ඩ, සිලෝන් තේ, තල්, පොල් ආශ්‍රිත නිෂ්පාදන සහ බතික් ඇඳුම් ආදි විවිධ අපනයන ක්ෂේත්‍ර නියෝජනය කරන ලදි.

ප්‍රදර්ශනය සඳහා රටවල් 70 ක අධික විදේශීය ගැනුම්කරුවන් / ආනයනකරුවන් 701 ක් සහභාගී වූ අතර මැලේසියාව, ඉරානය, කොරියාව, ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ෆීජි දූපත, රුසියාවේ, ගැම්බියාව, සෙනෙගල්, කටාර් සහ චීනය වැනි රටවල පාරිභෝගිකයන් හමුවීමට ශ්‍රී ලාංකේය අපනයනකරුවන්ට අවස්ථාවක් උදා විය. ප්‍රදර්ශනයට සමගාමීව පවත්වන ලද ශ්‍රී ලංකා ව්‍යාපාරික සංසදය හා B2B ජාල සැසියේ දී ද, පකිස්තානයේ කරච්චිහි ප්‍රධාන වෙළඳුන්, ආනයනකරුවන්, ගැනුම්කරුවන් හා අදාල ආයතනසභාපතිවරුන් විශාල පිරිසක් සහභාගී වූහ. එමෙන්ම ඇමෙරිකානු ඩොලර් 106,386 ක් වටිනා ස්ථිර වෙළෙඳ ඇණවුම් ලැබුණු අතර ඇමෙරිකානු ඩොලර් 656,166 ක වටිනාකමකින් යුතු වෙළෙඳ ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී. එමෙන්ම ප්‍රදර්ශනය අතරතුර දී ඒකාබද්ධ ව්‍යාපාර කිහිපයක් සඳහා සාකච්ඡා පවත්වන ලදි.






**අමාත්‍ය මණ්ඩල දූත පිරිස්**

**ස්වීඩනය**

2017 ජනවාරි 16 සිට 19 දක්වා ස්වීඩනයට අමාත්‍ය මණ්ඩල නියෝජිත පිරිසක ගේ සංචාරයක් සංවිධානය කර ඇති අතර ස්වීඩනයේ H & M, IKEA, We effect හා SIDA සමඟ ව්‍යාපාරික හමුවීම් පැවැත්වීම සඳහා පහසුකම් සැපයීය. ස්වීඩනයේ ඉහත සඳහන් සංවිධාන සමඟ පසු විපරම් සිදු කරනු ලැබේ. පසු විපරමක් ලෙස IKEA, We effect ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදුණි.

**තායිලන්තයේ බැංකොක්**

ගරු සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති සහ ප්‍රධාන විධායකතුමිය ඇතුළු අමාත්‍ය නියෝජිත පිරිසක ගේ තායිලන්ත සංචාරයක් 2017 පෙබරවාරි 16 සිට 18 දක්වා සංවිධානය කරන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තායිලන්ත රජයේ සහාය ලබා ගැනීම සඳහා වෙළෙඳ සංවර්ධන සහ ආයෝජන පිළිබඳ යෝජනා පහක් ඉදිරිපත් කරන ලදි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විදේශ ආයෝජකයන් කෙරෙහි අනුගමනය කරන ක්‍රම වේදය පිළිබඳ ව සොයා බැලීමට Rachana Group සමූහයේ ප්‍රධාන විධායක ශ්‍රී ලංකාවට පැමිණියේ ය.

**ජර්මනියේ කොලෝං, ප්‍රංශයේ පැරිස් සහ ඉතාලියේ මිලාන්**

ශ්‍රී ලාංකික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා ද්විපාර්ශ්වික රැස්වීම් යුරෝපා සංගමයේ ජර්මනියේ කොලෝං, ප්‍රංශයේ පැරිස් සහ ඉතාලියේ මිලාන් නගරයන් හි දී පවත්වන ලදී. මෙහි දී වසර ගණනාවක් ගත වූ පසු ලැබෙන යුරෝපා GSP + ප්‍රතිලාභ මත විශේෂයෙන් ප්‍රංශ ගැනුම්කරුවන් අතර ශ්‍රී ලංකාවේ ගුණාත්මක නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට අවස්ථාව උදා විය. මෙහි දී ගැනුම්කරුවන් ගේ මනස ගවේෂණයේ අවස්ථාව ශ්‍රී ලාංකික නිෂ්පාදකයන්ට ලැබුණු අතර ඔවුන්ගේ නිෂ්පාදන තීරණ වලට බලපෑම් කරන තත්ත්වය සහ තරගකාරිත්වය මත ප්‍රවර්ධන කටයුතු සැලසුම් කර ගැනීමට අවස්ථාව උදා විය.

## WEDF 2017

ගරු සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය තුමා, අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති සහ ප්‍රධාන විධායකතුමිය, අලෙවි සංවර්ධන අධ්‍යක්ෂ තුමිය ඇතුළු ශ්‍රී ලාංකික අපනයන සමාගම් 13 ක් මෙම වැඩ සටහනට සහභාගී විය. ශ්‍රී ලංකාව පිළිබඳ අවධානය යොමු කිරීමේ විශේෂ සම්මන්ත්‍රණයට අනතුරුව B2B රැස්වීම් පැවැත්වූ අතර ශ්‍රී ලාංකේය සමාගම් සමඟ B2B රැස්වීම් 40 ක් පමණ පැවැත්විණි. ශ්‍රී ලංකාව තුළ කොකෝවා වගා වර්ධනය වන වැඩි කිරීමට අප්‍රිකානු, කැරිබියානු සහ ජනපදයේ පැසිෆික් (ACP) සමූහයේ ලේකම් කාර්යාලයේ තාක්ෂණික සහයෝගිතාව ලබා ගැනීම පිළිබඳ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර කෙන්යාව හා සානා සුපිරි වෙළඳ ජාලා මගින් කැරිබියානු රටවල ප්‍රවර්ධනය විශේෂයෙන් අගය එකතු කළ කුළුබඩු ප්‍රවර්ධනය කිරීම සිදු කෙරේ.

### 10) විද්‍යුත් වාණිජ හා තොරතුරු තාක්ෂණ සේවා

**අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය සහ විද්‍යුත් අලෙවි මධ්‍යස්ථානය**

අපනයන සංවර්ධන මණ්ඩලයේ විද්‍යුත් අලෙවි මධ්‍යස්ථානය (e-MARKETPLACE) යනු අන්තර්ජාලය ඔස්සේ ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන හා සේවා වන් ප්‍රවර්ධනය කිරීම සහ වෙළඳාම සඳහා 2003 දී රාජ්‍ය විසින් හඳුන්වා දුන් පුරෝගාමී වෙළඳ ප්‍රවාහන මාධ්‍ය වේ. මෙමගින් B2B matchmaking සඳහා විශිෂ්ට වේදිකාවක් සැපයෙන අතර ජාත්‍යන්තර වශයෙන් මෙන්ම ජාතික අපනයන මට්ටමින් ද ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන හා සේවා වන් ප්‍රවර්ධනය කරයි. එමෙන්ම සැපයුම්කරුවන්, ගැනුම්කරුවන්, නැව් ගත කරන්නන්, භාණ්ඩ හා සේවා, සැපයුම්කරුවන් සහ මූල්‍ය තොරතුරු එකම වෙබ් අඩවියක් තුළින් ලබා ගැනීමට හැකි වීම මෙහි සුවිශේෂී බවයි. අතිශයින් ම ආරක්ෂිත මෘදුකාංගයකින් මෙම පද්ධතිය සවි බල ගන්වා ඇති අතර අතර අන්තර්ජාලය වෙත පිවිසිය හැකි ලොව ඕනෑම තැනක සිට මිලදී ගන්නන්ට මෙය විවෘත වේ.

පකිස්ථානය, ඕස්ට්‍රේලියාව, සෞදි අරාබිය, කැනඩාව, එක්සත් රාජධානිය, පිලිපීනය, ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, කුවේටය, ස්විට්සර්ලන්තය, ප්‍රංශය, සෞදි අරාබිය, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, පෝලන්තය, ඔස්ට්‍රියාව, තුර්කිය යනාදී රට වලට ඇමරිකානු ඩොලර් 3776.43 ක වටිනාකමකින් යුතු

වෙළෙඳ ගනුදෙනු 26 ක් මේ හරහා සිදු වී ඇත. විද්‍යුත් අලෙවි මධ්‍යස්ථානය තුළ ලියාපදිංචි වී ඇති සමාගම් සඳහා වෙළෙඳ විමසීම් 843 ක් ලැබී ඇත.

අපනයනකරුවන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 120 දෙනෙක් සඳහා අන්තර්ජාල වෙළදාමේ ඩිජිටල් ද්වාර පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් අපනයන සංවර්ධන මණ්ඩල පරිශ්‍රයේ 2017 අගෝස්තු මස 29 වැනි දින පවත්වන ලදී. මණ්ඩලීය වෙබ් අඩවියේ අපනයන සංවර්ධන මණ්ඩලීය තොරතුරු සහිත ලිපි 92 ක් හා ෆේස් බුක් සමාජ ජාලීය වෙබ් අඩවියේ ලිපි 300ක් ප්‍රකාශයට පත් කර ඇත.

## 11) වෙළඳ පහසුකම් සැපයීම සහ වෙළඳ තොරතුරු සහ දැනුම හුවමාරු කිරීම

### අපනයනකරුවන්ගේ සංසදය

අපනයනකරුවන් මුහුණ පාන ගැටළු වලට සුදුසු පිළියම් ලබාදීමේ අරමුණින්, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ගරු ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අදාල රාජ්‍ය ආයතන හා එක්ව 2017 ජුලි 18 සහ නොවැම්බර් 21 දිනයන් හි 11 වන සහ 12 වන අපනයන සංසදයන් පවත්වන ලදි.

රාජ්‍ය සහ පෞද්ගලික ආයතන නියෝජනය කරමින් නිලධාරීන් රාශියක් මේ සඳහා සහභාගි වූ අතර ක්‍රියා පටිපාටි පිළිබඳ ගැටළු වල සිට ප්‍රතිපත්තිමය ගැටළු දක්වා සියළු ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ගැටළු 22ක් සාකච්ඡාවට ගන්නා ලදි.

ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටුවට අපනයනකරුවන් කෙරෙහි බලපාන ගැටළු පිළිබඳ ලිපියක් ඉදිරිපත් කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස, 2017 මාර්තු මස 28 වන දින තේ, රබර්, පොල්, ඇඟලුම්, ධීවර හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයන් හි නිරත අපනයනකරුවන්ගේ ගැටළු වලට සුදුසු පිළියම් ලබාදීම සඳහා රැස්වීමක් ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ උපදේශක තුමා ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. ඉන් අනතුරුව අපනයන ක්ෂේත්‍රයේ පවතින මූල්‍ය සහ පිස්කල් ගැටළු විසඳීම සඳහා ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ උපදේශක තුමා ගේ ප්‍රධානත්වයෙන් රැස්වීම් 6ක් පවත්වන ලදි.

### පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

අපනයන සහ ආනයන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා 3ක් අයදුම්කරුවන් 162 දෙනෙක් සඳහා පවත්වන ලදි.

83 වන සහ 84 වන අන්තර්ජාතික වෙළෙඳාමේ අංගයන් පිළිබඳ පාඨමාලා 1ක් අයදුම්කරුවන් 80 දෙනෙක් සඳහා පවත්වන ලදි.

### අපනයන සංවර්ධන මණ්ඩලයීය ප්‍රකාශන

අන්තර්ජාතික වෙළෙඳාමේ නව ප්‍රවණතා සහ සංවර්ධන කරුණු පිළිබඳ "Business Lanka" සඟරා හතරක් 2017 වසර තුල නිකුත් කරන ලදි.

අපනයන ක්ෂේත්‍රයේ දශකයක් සංඛ්‍යාලේඛන ඇතුලත් 2016 අපනයන ප්‍රගති දර්ශකය මුද්‍රිත හස සංයුක්ත තැටි පිටපත් ආකාරයෙන් සකස් කර අදාල ආයතනයන්, වෙළෙඳ මණ්ඩල, විදේශීය දූත මණ්ඩල සහ විශ්ව විද්‍යාල වැනි ආයතන සඳහා බෙදා හරින ලදි.

පකිස්තානයේ තේ, සවුදි අරාබියේ ශල්‍ය අත් වැසුම්, පොල් වතුර සහ ගමන් මළු, ස්වීඩනයේ පොල් ආශ්‍රිත නිෂ්පාදන, දකුණු අප්‍රිකාවේ මෝටර් රථ උපාංග, පොල් වතුර සහ පාවහන් නිෂ්පාදන පිළිබඳ තොරතුරු

වාර්තා ශ්‍රී ලාංකීය විදේශ දූත මණ්ඩල නිලධාරින් හා එක්ව සකස් කර මුද්‍රණය කරන ලදි. එමෙන්ම මෙම වාර්තා මණ්ඩලීය වෙබ් අඩවිය තුල අපනයනකරුවන්ගේ පරිශීලනය සඳහා අන්තර්ගත කර ඇත.

**අපනයන සංවර්ධන මණ්ඩලීය ස්වයංක්‍රීය තොරතුරු පද්ධතිය “KIOSK”**

අපනයන සංවර්ධන මණ්ඩලීය වෙත තොරතුරු සොයා පැමිණෙන්නන්ගේ පහසුව සඳහා මෙම දත්ත පද්ධතිය 2017 ජනවාරි මස මණ්ඩලීය පරිශ්‍රයේ බිම් මහලේ ස්ථාපනය කරන ලදි. මෙමගින් අපනයන කරුවන් ලියාපදිංචිය, වෙළෙඳ තොරතුරු, අපනයන නිෂ්පාදන සහ සේවා පිළිබඳ තොරතුරු ආදිය ලබා ගැනීමට මණ්ඩලය වෙත පිවිසෙන්නන් සඳහා සැපයෙන පහසුකම් තවදුරටත් පුළුල් කරන ලදි. මෙම ස්වයංක්‍රීය සේවා පද්ධතිය සතියේ දින වල පෙරවරු 8.00 සිට පස්වරු 6.00 දක්වා ක්‍රියාත්මක වේ.

*ප්‍රතිපත්ති හා උපායමාර්ගික සැලසුම් අංශය*

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

**2017.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | එස්. එල්. එෆ්.ආර්.එස් 31.12.2017 | එස්. එල්. එෆ්.ආර්.එස් 31.12.2016 |
|---|---|---|---|
| **වත්කම්** | | රු. ශත. | රු. ශත. |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ශුද්ධ දේපල පිරියත හා උපකරණ | (9) | 61,652,670.48 | 70,955,617.17 |
| සඳහන් නොකෙරුණු සමාගම් ආයෝජන | (10) | 1,088,674,019.00 | 1,012,467,874.00 |
| | | 1,150,326,689.48 | 1,083,423,491.17 |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | (11) | 38,828,250.00 | 40,548,150.00 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 1,189,154,939.48 | 1,123,971,641.17 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | (12) | 2,123,332.25 | 1,840,628.54 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | (13) | 159,510,512.88 | 157,757,770.55 |
| අත්තිකාරම් හා ඉදිරි ගෙවීම් | (14) | 19,025,319.66 | 17,297,453.45 |
| මුදල් හා මුදල් සමාන දෑ | (15) | 3,052,305.92 | 38,622,546.20 |
| | | 183,711,470.71 | 215,518,398.74 |
| **මුළු වත්කම්** | | **1,372,866,410.19** | **1,339,490,039.91** |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධන සහ වෙන් කිරීම්** | | | |
| ආධාර ලැබීම - ප්‍රාග්ධන දායකත්වය | (16) | 10,014,284.00 | 10,014,284.00 |
| වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය | | 1,093,329,045.03 | 1,114,175,562.99 |
| **මුළු හිමිකම්** | | 1,103,343,329.03 | 1,124,189,846.99 |
| **ආධාර** | | | |
| ආධාර ලැබීම් - වෙනත් | (17) | 33,046,261.17 | 32,967,988.25 |
| | | 33,046,261.17 | 32,967,988.25 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| වෙන්කිරීම් හා අනිකුත් වගකීම් | (18) | 9,024,373.57 | 30,489,828.08 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | (19) | 89,981,884.30 | 88,057,017.00 |
| | | 99,006,257.87 | 118,546,845.08 |
| **ජංගම වගකීම** | | | |
| අනිකුත් ගෙවීම් | (20) | 99,243,941.67 | 63,785,359.59 |
| බැංකු අයිරාව | (21) | 38,226,620.45 | - |
| | | 137,470,562.12 | 63,785,359.59 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **1,372,866,410.19** | **1,339,490,039.91** |

මෙම මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරණු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2017.12. 31 දිනට අත්සන් කලේ,

| | | | |
|---|---|---|---|
| ................................ | ................................ | ........................ | ................................ |
| ඉන්දිරා මල්වත්ත | ඩබ්. ඒ. ඩී. එස්. ගුණසිංහ | රොහාන් අබේකෝන් | ජී. එම්. හේරත් |
| සභාපතිනිය සහ ප්‍රධාන විධායක | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | මුදල් අධ්‍යක්ෂිකා |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් හා වියදම් ප්‍රකාශය

| | සටහන | එස්. එල්. එෆ්. ආර්.එස් 31.12.2017 රු. ශත. | එස්. එල්. එෆ්. ආර්. එස් 31.12.2016 රු. ශත. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ආදායම | (3) | 430,305,985.15 | 467,499,501.27 |
| අනෙකුත් ආදායම් | (4) | 150,526,909.55 | 125,162,153.67 |
| මුළු ආදායම | | 580,832,894.70 | 592,661,654.94 |
| **වියදම්** | | | |
| අපනයන සංවර්ධන වියදම | (5) | (227,356,965.19) | (208,013,222.29) |
| පරිපාලන වියදම | (6) | (371,931,635.89) | (337,721,924.35) |
| මෙහෙයුම් වියදම් ඉක්මවූ ආදායම | | (18,455,706.38) | 46,926,508.30 |
| මූල්‍ය වියදම් | (7) | (1,826,767.26) | (1,152,602.68) |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වියදම ඉක්මවූ අතිරික්තය | | (20,282,473.64) | 45,773,905.62 |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | | |
| දේපල හා පිරියත උපලබ්ධියෙන් ලාභ/(අලාභ) | (8) | - | - |
| වර්ෂයේ අනිකුත් මුළු ආදායම | | - | - |
| **වර්ෂයේ මුළු ආදායම** | | **(20,282,473.64)** | **45,773,905.62** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
2017.12.31 දිනට අවසන් වර්ෂය සඳහා
**හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය**

| | | රාජ්‍ය ආධාර | සමුච්චිත ලාභ | එකතුව |
|---|---|---|---|---|
| **2015.12.31 දිනට ශේෂය** | | 10,014,284.00 | 1,092,316,061.15 | 1,102,330,345.15 |
| සාමාන්‍ය ක්‍රියා වලින් වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය | | - | 45,773,905.62 | 45,773,905.62 |
| පෙර වර්ෂයේ ගැලපීම | | - | (23,914,403.78) | (23,914,403.78) |
| **2016.12.31 දිනට ශේෂය** | | **10,014,284.00** | **1,114,175,562.99** | **1,124,189,846.99** |
| සාමාන්‍ය ක්‍රියා වලින් වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය | | - | (20,282,473.64) | (20,282,473.64) |
| පෙර වර්ෂයේ ගැලපීම් | (24) | - | (564,044.32) | (564,044.32) |
| **2017.12.31 දිනට ශේෂය** | | **10,014,284.00** | **1,093,329,045.03** | **1,103,343,329.03** |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2017.12.31 දිනට අවසන් වර්ෂය සඳහා - මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. |
| **මෙහෙයුම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලද වියදමට වැඩි ආදායම | | (20,282,474) | 45,773,906 |
| **ගැලපීම්** | | | |
| ක්ෂයවීම් | | 12,789,848 | 14,443,692 |
| ආයෝජන වලින් ලද ආදායම | | (138,631,888) | (115,584,844) |
| පෙර වර්ෂය සඳහා ගැලපුම් | | (564,044) | (23,957,483) |
| මූල්‍ය වියදම | | 355,113 | 367,361 |
| රාජ්‍ය ලැබීම් සඳහා ක්‍රමක්ෂය | | (5,312,349) | (4,124,053) |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 12,490,723 | 5,211,847 |
| හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන | | 1,719,900 | - |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)** | | **(137,435,172)** | **(77,869,574)** |
| තොගය (වැඩිවීම)/අඩුවීම | | (282,704) | 2,873 |
| ණය ගැති හා ලැබියයුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | (1,752,742) | (13,838,103) |
| අත්තිකාරම් හා කලින් ගෙවම් (වැඩිවීම)/අඩුවීම | | (1,727,866) | 20,894,584 |
| වෙන්කිරීම් හා වෙනත් ගෙවියයුතු දෑ වැඩිවීම/(අඩුවීම) | | (21,465,455) | 1,305,686 |
| වෙනත් ගෙවියයුතු දෑ වැඩිවීම/ (අඩුවීම) | | 35,458,582 | 11,310,374 |
| **මෙහෙයුම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | **(127,205,356)** | **(58,194,160)** |
| මූල්‍ය වියදම් ගෙවීම් | | (355,113) | (367,361) |
| පාරිතෝෂික ගෙවීම් | | (10,565,856) | (10,348,097) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ගලායාම** | | **(138,126,325)** | **(68,909,619)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම් | 9 | (3,486,901) | (5,549,963) |
| ලාභාංශ ලැබීම් | 4 | 60,166,344 | 42,859,381 |
| පොලී ලැබීම් | 4 | 2,259,399 | 2,269,747 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලාඑම** | | **58,938,842** | **39,579,165** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| රාජ්‍ය ආධාර ලැබීම් | | 5,390,622 | 5,549,963 |
| **මූල්‍ය ක්‍රියායාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **5,390,622** | **5,549,963** |
| **වර්ෂය තුල මුදල් හා මුදල් සමාන දෑ වැඩිවීම/අඩුවීම** | | **(73,796,861)** | **(23,780,490)** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | 38,622,546 | 62,403,036 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | **(35,174,315)** | **38,622,546** |
| **මුදල් හා මුදල් සමානම දෑ විශ්ලේෂණය** | | | |
| අතැති මුදල් | 15 | 71,357 | 67,794 |
| බැංකුවේ ඇති මුදල් | 15 | 2,980,948 | 38,554,752 |
| බැංකු අයිරා | 21 | (38,226,620) | - |
| | | **(35,174,315)** | **38,622,546** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2017.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන්**

| | | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2017 රු. ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2016 රු. ශත. |
|---|---|---|---|
| **(3)** | **ආදායම** | | |
| | රාජ්‍ය ලැබීම් | 352,643,377.60 | 364,450,037.49 |
| | අපනයන සේවා ආදායම් | 59,963,966.00 | 64,859,625.56 |
| | පලාත් කාර්යාල ආදායම් | 92,119.82 | 167,933.64 |
| | අන්තර්ජාල ආදායම් | 577,429.00 | 426,630.00 |
| | විද්‍යුත් වෙළඳ ආදායම | 557,729.87 | 709,721.18 |
| | WEDF 2016 ආදායම | 750,000.00 | 24,875,721.90 |
| | සම්මන්ත්‍රණ හා පාඨමාලා ගාස්තු | 5,249,544.81 | 5,782,433.25 |
| | වෙළඳ කුටි ආදායම - සම් භාණ්ඩ ප්‍රදර්ශනය 2016 | - | 4,380,827.25 |
| | පොත් අලෙවිය | 232,946.00 | 250,071.00 |
| | අනෙකුත් ආදායම් | 10,238,872.05 | 1,596,500.00 |
| | | **430,305,985.15** | **467,499,501.27** |
| **(4)** | **අනෙකුත් ආදායම්** | | |
| | පොලී ආදායම් | 2,259,399.30 | 2,269,747.27 |
| | ආශ්‍රිත සමාගම් ලාභ | 76,206,145.00 | 70,455,716.00 |
| | ලාභාංශ | 60,166,343.52 | 42,859,380.87 |
| | අනිකුත් විවිධ ආදායම් | 2,158,379.62 | 1,700,906.88 |
| | ක්‍රමක්ෂය රාජ්‍ය ආධාර | 5,312,349.48 | 4,124,053.01 |
| | සේවක ණය පොලී (IFRS) | 4,424,292.63 | 3,752,349.64 |
| | | **150,526,909.55** | **125,162,153.67** |
| **(5)** | **අපනයන සංවර්ධන වියදම්** | | |
| | අපනයන සංවර්ධන වැඩසටහන් | 76,408,185.53 | 61,337,586.37 |
| | අපනයන වෙළඳ ප්‍රවර්ධන - විදේශ | 119,288,970.12 | 76,493,976.99 |
| | වෙළඳ නියෝජිත සහභාගිත්වය | 5,670,183.64 | 1,376,597.02 |
| | WEDF - 2016 | 1,552,325.10 | 40,014,026.29 |
| | දේශීය වෙළඳ ප්‍රදර්ශන | 2,456,888.96 | 9,674,043.85 |
| | ප්‍රතිපත්ති හා සැලසුම් | 2,221,120.84 | 2,001,362.60 |
| | අපනයන වෙළඳ ප්‍රවර්ධන - දේශීය | 9,331,035.42 | 3,679,480.05 |
| | ප්‍රාදේශීය සංවර්ධන වියදම් | 7,005,857.70 | 5,233,500.76 |
| | වෙළඳ තොරතුරු හා සේවා වියදම් | 3,403,181.88 | 3,934,690.92 |
| | අන්තර්ජාල වියදම | 1,375.00 | 3,958,664.26 |
| | ඒකාබද්ධ කෘෂි ආදර්ශ ව්‍යාපෘති | - | 128,642.67 |
| | ශ්‍රී ලංකා කුරුඳු සන්නම් නිර්මාණය | 17,841.00 | 180,650.51 |
| | | **227,356,965.19** | **208,013,222.29** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

**2017.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන්**

| | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2017 රු. ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2016 රු. ශත. |
|---|---|---|
| **(6) පරිපාලන වියදම්** | | |
| වැටුප් හා වේතන | 138,409,028.75 | 123,917,943.23 |
| අතිකාල හා නිවාඩු දීමනා | 6,552,924.53 | 7,362,820.56 |
| ප්‍රසාද දීමනා | 2,560,467.00 | 2,623,012.50 |
| සේවක අර්ථ සාධක අරමුදල | 17,884,441.25 | 16,261,980.65 |
| සේවක භාරකාර අරමුදල | 5,622,626.35 | 3,252,520.45 |
| විශ්‍රාම වැටුප් | - | 24,260.50 |
| පාරිතෝෂික දීමනා | 12,490,722.80 | 5,211,847.00 |
| සුභසාධන | 21,011,481.41 | 19,650,818.36 |
| බඳවාගැනීම් වියදම් | 1,963,607.63 | 1,530,207.02 |
| සේවක පිරිවැය | 4,424,292.63 | 3,752,349.64 |
| විදුලි ගාස්තු | 20,154,823.66 | 20,238,022.91 |
| ජල ගාස්තු | 804,555.82 | 2,217,775.87 |
| නීති හා වෙනත් වෘත්තීය ගාස්තු | 80,627.50 | 422,340.00 |
| ප්‍රචාරණය | 917,037.59 | 667,063.83 |
| ආරක්ෂක වියදම් | 7,255,348.17 | 5,519,112.50 |
| විගණන ගාස්තු | 700,000.00 | 700,000.00 |
| මුද්‍රණ වියදම් | 604,845.50 | 214,102.00 |
| ගමන් වියදම් | 13,809,986.34 | 12,493,161.26 |
| විනෝදාශ්වාද | 182,968.12 | 208,895.04 |
| පොදු වියදම් | 1,532,242.92 | 473,530.96 |
| අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු | 1,164,579.06 | 1,363,111.00 |
| කාර්යාල උපකරණ නඩත්තුව | 3,453,626.24 | 1,877,502.36 |
| ගොඩනැගිලි කුලී | 63,545,733.86 | 63,833,098.44 |
| ඉන්ධන හා තෙල් | 5,190,773.70 | 5,502,086.42 |
| වාහන නඩත්තු අලුත්වැඩියා | 4,423,394.54 | 4,200,261.53 |
| පුද්ගලික කුලී | 7,443,849.90 | 6,167,596.61 |
| සන්නිවේදන හා සාමාජික මුදල් | 9,161,319.09 | 7,664,593.68 |
| ක්ෂය | 13,292,731.86 | 14,443,691.73 |
| දේශීය පුහුණු වියදම් | 928,587.10 | 1,196,520.33 |
| කාර්යාල අවශ්‍යතා | 4,217,798.02 | 3,973,473.89 |
| විදේශීය පුහුණු වියදම් | 2,147,214.55 | 758,224.08 |
| | **371,931,635.89** | **337,721,924.35** |

| | | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2017 රු ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2016 රු ශත. |
|---|---|---|---|
| **(7)** | **මූල්‍ය පිරිවැය** | | |
| | පොලී වියදම් | 355,113.32 | 367,361.20 |
| | මුද්දර ගාස්තු | 728,028.76 | 82,418.92 |
| | මූල්‍ය වියදම් | 743,625.18 | 702,822.56 |
| | | **1,826,767.26** | **1,152,602.68** |

**(8) මෝටර් රථ ප්‍රත්‍යාගණය**

මණ්ඩලයට අයිති මෝටර් රථ ශ්‍රී ලංකා ඔටෝමොබයිල් සමාගම විසින් 2012.12.31 දිනට නැවත අගය කරන ලදි. වසර පහකට වරක් මෝටර් රථ වාහන නැවත අගය කිරීමට බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2017.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන්

## (9) දේපල යන්ත්‍ර හා උපකරණ

### (9.1) පිරිවැය

| ශේෂය 01/01/2016 | වත්කම් | ශේෂය 01/01/2017 | එකතුකිරීම් | නැවත තක්සේරු කිරීම | ඉවත් කිරීම් | ශේෂය 31/12/2017 |
|---|---|---|---|---|---|---|
| 99,364.00 | ගෘහස්ත දුරකථන | 99,364.00 | 33,150.00 | - | 16,072.00 | 116,442.00 |
| 75,110,000.00 | මෝටර් රථ | 75,343,100.00 | 33,350.00 | - | - | 75,376,450.00 |
| 33,249,894.02 | පරිගණක | 36,802,808.52 | 1,952,900.00 | - | - | 38,755,708.52 |
| 6,066,080.50 | පරිගණක මෘදුකාංග | 6,066,080.50 | 1,606,400.00 | - | 1,920,799.50 | 5,751,681.00 |
| 1,006,347.32 | පරිගණක උපකරණ | 1,053,894.45 | 309,048.40 | - | - | 1,362,942.85 |
| - | කියොස්ක් පද්ධතිය | 735,930.00 | - | - | - | 735,930.00 |
| 4,797,345.01 | රූපවාහිනී උපකරණ | 4,816,845.01 | - | - | - | 4,816,845.01 |
| 65,549.00 | පී.ඒ.බී.එක්ස් උපකරණ | 65,549.00 | - | - | - | 65,549.00 |
| 1,507,160.14 | දුරකථන සවිකිරීම් | 1,540,830.14 | 91,172.00 | - | - | 1,632,002.14 |
| 14,799,732.29 | ලී බඩු සවිකිරීම | 15,595,618.57 | 248,688.50 | - | - | 15,844,307.07 |
| 15,602,735.99 | කාර්යාල උපකරණ | 15,734,150.59 | 1,133,823.50 | - | - | 16,867,974.09 |
| - | වෙනත් උපකරණ | - | 15,240.00 | - | - | 15,240.00 |
| **152,304,208.27** | | **157,854,170.78** | **5,423,772.40** | - | **1,936,871.50** | **161,341,071.68** |

### (9.2) ක්ෂය වෙන්කිරීම්

| ශේෂය 01/01/2016 | වත්කම | ශේෂය 01/01/2017 | වර්ෂය සඳහා ක්ෂය | ඉවත් කිරීම් සඳහා ක්ෂය වෙන් කිරීම් | ශේෂය 31/12/2017 |
|---|---|---|---|---|---|
| 75,489.06 | ගෘහස්ත දුරකථන | 82,610.70 | 6,996.81 | 20,850.36 | 68,757.15 |
| 19,048,499.99 | මෝටර් රථ | 27,287,269.99 | 8,256,083.33 | - | 35,543,353.32 |
| 27,200,981.93 | පරිගණක | 30,345,411.54 | 2,196,391.28 | - | 32,541,802.82 |
| 2,711,589.07 | පරිගණක මෘදුකාංග | 3,682,713.82 | 602,916.55 | 480,199.88 | 3,805,430.49 |
| 559,173.66 | පරිගණක උපකරණ | 732,927.67 | 151,696.17 | - | 884,623.84 |
| - | කියොස්ක් පද්ධතිය | 12,265.50 | 147,186.00 | - | 159,451.50 |
| 3,525,047.67 | රූපවාහිනී උපකරණ | 3,753,808.78 | 230,711.11 | - | 3,984,519.89 |
| 34,197.11 | පී.ඒ.බී.එක්ස් උපකරණ | 40,752.01 | 6,554.90 | - | 47,306.91 |
| 1,421,589.43 | දුරකථන සවිකිරීම | 1,505,217.02 | 38,718.41 | - | 1,543,935.43 |
| 6,547,088.24 | ලී බඩු සවිකිරීම | 7,275,394.00 | 775,365.73 | - | 8,050,759.73 |
| 11,331,205.72 | කාර්යාල උපකරණ | 12,180,182.58 | 877,972.54 | - | 13,058,155.12 |
| - | වෙනත් උපකරණ | - | 305.00 | - | 305.00 |
| **72,454,861.88** | | **86,898,553.61** | **13,290,897.83** | **501,050.24** | **99,688,401.20** |

| | ලියා හරින ලද වටිනාකම | 2017 | 2016 |
|---|---|---|---|
| 152,304,208.27 | පිරිවැය | 161,341,071.68 | 157,854,170.78 |
| (72,454,861.88) | සමුච්චිත ක්ෂය කිරීම් | (99,688,401.20) | (86,898,553.61) |
| **79,849,346.39** | ලියා හරින ලද වටිනාකම | **61,652,670.48** | **70,955,617.17** |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
**2017.12.31 අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන්**

| | | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2017 | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2016 |
|---|---|---|---|
| | | රු ශත. | රු ශත. |
| **(10)** | **ආශ්‍රිත සමාගම් ආයෝජන - ලැයිස්තුගත නොවන** | | |
| | ආශ්‍රිත සමාගම් ආයෝජන - ඩී.එච්.පී.එල්. | 1,088,674,019.00 | 1,012,467,874.00 |
| | | **1,088,674,019.00** | **1,012,467,874.00** |
| **(11)** | **වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම්** | | |
| | නිදහස් කළ හැකි වරණීය කොටස් | 105,066,208.78 | 105,058,083.78 |
| | සාමාන්‍ය කොටස් | 58,312,483.61 | 58,312,483.62 |
| | (-) හානිකරණ සඳහා වෙන් කිරීම් | (124,550,442.39) | (122,822,417.40) |
| | | **38,828,250.00** | **40,548,150.00** |
| **(12)** | **තොගය** | | |
| | ලිපිද්‍රව්‍ය | 2,123,332.25 | 1,840,628.54 |
| | | **2,123,332.25** | **1,840,628.54** |
| **(13)** | **වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | | |
| | අපනයනකරුවන්ගේ ණය | 41,348,001.60 | 45,183,838.60 |
| | (-) ණයගැති හානිකරණ වෙන් කිරීම් | (41,348,001.60) | (44,176,573.65) |
| | කාර්ය මණ්ඩල ණය | 40,453,916.07 | 40,813,910.25 |
| | (-) ගෙවිය යුතු සේවක පිරිවැය | (556,424.43) | (3,940,875.88) |
| | ලැබිය යුතු වැට් | 104,676,878.80 | 104,676,878.80 |
| | වෙනත් තැන්පතු | 14,936,142.44 | 15,200,592.43 |
| | | **159,510,512.88** | **157,757,770.55** |
| **(14)** | **අත්තිකාරම් හා ගෙවීම්** | | |
| | ගෙවීම් | 2,463,069.30 | 4,289,831.97 |
| | අත්තිකාරම් | 13,125,175.77 | 6,350,095.44 |
| | බැංකු සුරක්ෂිත | 300,000.00 | 300,000.00 |
| | සේවා තැන්පතු | 1,497,260.00 | 1,307,260.00 |
| | ආපසු ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතු | 969,390.16 | 969,390.16 |
| | අවලංගු චෙක්පත් | 114,000.00 | 140,000.00 |
| | කලින් ගෙවූ කාර්ය මණ්ඩල වියදම් | 556,424.43 | 3,940,875.88 |
| | | **19,025,319.66** | **17,297,453.45** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2017.12.31 අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන්**

| | | එස්.එල්.එෆ් ආර්.එස් 31.12.2017 රු ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2016 රු ශත. |
|---|---|---|---|
| **(15)** | **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| | ලංකා බැංකුව - මුදල් අයකැමි තැන්පත් | 2,500.00 | 2,500.00 |
| | ලංකා බැංකුව - ලේක් වීව් (306605) | - | 32,293,112.53 |
| | ජාතික සංවර්ධන බැංකුව | 2,535,581.62 | 1,017,863.61 |
| | ලංකා බැංකුව - කෝපරේට් ශාඛාව | 212,229.35 | 227,280.45 |
| | ඩී. එෆ්. සී. සී. - කෝපරේට් ශාඛාව | 198,890.00 | 4,998,890.00 |
| | සම්පත් බැංකුව - මහනුවර | 5,181.92 | 4,917.32 |
| | සම්පත් බැංකුව - ගාල්ල | 7,332.63 | 7,086.81 |
| | ලංකා බැංකුව - මන්නාරම | 2,125.26 | 1,385.45 |
| | සම්පත් බැංකුව- කුරුණෑගල | 17,107.67 | 1,716.21 |
| | අතැති මුදල් | 71,357.47 | 67,793.82 |
| | | **3,052,305.92** | **38,622,546.20** |
| **(16)** | **රජයේ ලැබීම් - ප්‍රාග්ධන දායකය** | | |
| | රජයේ දායකය | 7,904,002.00 | 7,904,002.00 |
| | යූ.එන්.ඩී.පී. දායකය | 2,110,282.00 | 2,110,282.00 |
| | | **10,014,284.00** | **10,014,284.00** |
| **(17)** | **රජයේ ලැබීම්** | | |
| | රජයේ දායකය - මෝටර් රථ | 38,826,450.00 | 38,793,100.00 |
| | රජයේ දායකය - වෙනත් | 10,674,134.92 | 5,316,862.51 |
| | අයි.ටී.සී දායකය | 12,716.35 | 12,716.35 |
| | අපනයන ප්‍රවර්ධන ලේකම් කාර්යාලය | 202,677.32 | 202,677.32 |
| | (-) රජයේ ආධාර ක්‍රමක්ෂය | (16,669,717.42) | (11,357,367.93) |
| | | **33,046,261.17** | **32,967,988.25** |
| **(18)** | **වෙනත් වගකීම් හා වෙන්කිරීම්** | | |
| | ණය ආධාර ක්‍රම දායකත්වය | 7,796,197.30 | 7,954,151.81 |
| | ඌව පරණගම ආශ්‍රිත ගම්මාන | 2,108,251.77 | 2,108,251.77 |
| | අපනයනකරු දායකත්වය | 1,852,791.00 | 23,712,791.00 |
| | ඌව පරණගම පාලන ගිණුම | (10,403,683.00) | (10,403,683.00) |
| | ආපසු ගෙවිය යුතු තැන්පතු | 7,670,816.50 | 7,118,316.50 |
| | | **9,024,373.57** | **30,489,828.08** |
| **(19)** | **පාරිතෝෂික සඳහා වෙන් කිරීම්** | | |
| | ඉදිරියට ගෙන ආ ශේෂය | 88,057,017.00 | 93,193,267.00 |
| | වර්ෂය තුල කළ වෙන් කිරීම් | 12,490,722.80 | 5,211,847.00 |
| | වර්ෂය තුල කළ ගෙවීම් | (10,565,855.50) | (10,348,097.00) |
| | ඉදිරියට ගෙන ආ ශේෂය | **89,981,884.30** | **88,057,017.00** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2017.12.31 අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන්**

| | | එස්,එල්.එෆ් ආර්.එස් 31.12.2017 රු ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2016 රු ශත. |
|---|---|---|---|
| **(20)** | **වෙනත් ගෙවියයුතු දෑ** | | |
| | ගෙවිය යුතු මුද්දර ගාස්තු | 24,575.00 | - |
| | නොගෙවන ලද වැටුප් | 126,320.36 | 33,422.30 |
| | ගෙවිය යුතු විවිධ වියදම් | 165,853.70 | 1,338.53 |
| | ගෙවිය යුතු සේ. අ. අ. වියදම් | 36,323,276.18 | 33,802,601.95 |
| | ගෙවිය යුතු සේ.භා. අ. වියදම් | 306,222.56 | 3,741.67 |
| | සේවක අවසාන ගෙවීම් | 22,605.36 | 33,005.36 |
| | ගෙවිය යුතු වැටුප | 116,522.77 | - |
| | ගෙවිය යුතු විගණන ගාස්තු | 1,994,672.00 | 1,294,672.00 |
| | නැවත ගෙවිය යුතු ආරක්ෂක තැන්පතු | 2,500.00 | 2,500.00 |
| | නැවත ගෙවිය යුතු තැන්පතු- ටෙන්ඩර් | 243,000.00 | 6,000.00 |
| | ඉදිරිපත් නොකල චෙක්පත් | 388,340.16 | 162,153.88 |
| | වෙනත් උපචිත වියදම් | 59,530,053.58 | 28,445,923.90 |
| | | **99,243,941.67** | **63,785,359.59** |
| **(21)** | **බැංකු අයිරාව** | | |
| | ලංකා බැකුව - ලේක් වීව් | 38,226,620.45 | - |
| | | **38,226,620.45** | **-** |

**(22)** ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත 39 ට අනුව හිමිකම් කොටස් ආයෝජනය හානිකරණ පරීක්ෂා කරන ලදි. එ අනුව 01.01.2011 දිනට හානිකරණ වෙන් කිරීම නැවත ගැලපීම රු 31,698,150 කි.

**(23) (23.1)** **කාර්ය මණ්ඩල ණය**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 39 ට අනුව 01.01.2013 දිනට පැවති කාර්ය මණ්ඩල ණය පවත්නා පොලී අනුපාතයට අනුව හානිකරණ පාඩු අඩුකොට අවකරණය කරන ලදි . එ අනුව ඉදිරියට කළ කාර්ය මණ්ඩල පිරිවැය සහ එස්.එල්.එෆ් ආ'ර්.එස් ගැලපීම් අගය රු: 16,060,711.67 ගිණුම්කරණ පොත්වල ගලපන ලදි.

**(23.2)** එස්.එල්.එෆ් ආ'ර්.එස්.ගැලපීම් ගිණුමේ ශේෂය කාර්ය මණ්ඩල ණය ගිණුමෙන් අඩුකරන ලදි. එ අනුව කාර්ය මණ්ඩල ණය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සාධාරණ අගයට පෙන්වා ඇත.

| | |
|---|---|
| කාර්ය මණ්ඩල ණය | 40,453,916.07 |
| එස්,එල්.එෆ් ආර්.එස් ගැලපීම් | (556,424.43) |
| | 39,897,491.64 |

**(23.3)** ඉහත ගැලපීමෙන් හටගත් ඉදිරියට කළ කාර්ය මණ්'ඩල පිරිවැය ජංගම වත්කම් යටතේ පෙන්වා ඇත.

| | |
|---|---|
| ඉදිරියට කළ කාර්ය මණ්ඩල පිරිවැය | 556,424.43 |

## (24) පෙර වර්ෂයේ ගැලපීම්

පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි හඳුනාගැනීම් සහ මිනුම් සම්බන්ධව සිදු වී ඇති වැරදි නිවැරදි කිරීම් වලට අදාළ ගැලපීම් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සිදුකර ඇත.

| පෙර වර්ෂයේ වැරදිවල ස්වභාවය | මූල්‍ය ප්‍රකාශනවලට බලපාන අයිතමය | වටිනාකම (රු.) |
|---|---|---|
| උපචිත වියදම් අධි වෙන්කිරීම් ගැලපීම | අදාළ වියදම් ගිණුම | 702,151.70 |
| සමුච්චිත ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගැලපීම | ක්ෂය වියදම් ගිණුම | 493,247.39 |
| හානිකරණ සඳහා ප්‍රතිපාදන ගැලපීම | අගය අඩු කිරීම සඳහා ප්‍රතිපාදන ගිණුම | (1,719,900.00) |
| වෙනත් (ශුද්ධ) | අදාළ ලෙජර් ගිණුම | (39,543.41) |
| | | **564,044.32** |

## (25) සම්බන්ධිත පාර්ශවයන් සමග ගනුදෙනු

සම්බන්ධිත පාර්ශවයන් සමග ගනුදෙනු ලෙස සලකනු ලබන්නේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී තම ආශ්‍රිත සමාගම වූ ඩිවලොප්මන්ට් හෝල්ඩින් (පුද්ගලික) සමාගමට කරනු ලබන ගෙවීම්ය. 2017 වසර තුළ සම්බන්ධිත පාර්ශවයන් සමග පහත ගනුදෙනු සිදුකර ඇත.

| නම | ගනුදෙනුව | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|
| ඩිවලොප්මන්ට් හෝල්ඩින් (පුද්ගලික) සමාගම | මාසික කුලිය | 60,000,000.00 | 59,598,214.28 |
| | වාහන ගාල් කිරීමේ ගාස්තු | 394,285.68 | 384,000.03 |
| | ශ්‍රවණාගාර ගාස්තු | 405,303.74 | 438,304.85 |
| | ලාභාංශ ලැබීම් | 36,244,971.00 | 36,244,971.00 |

## (26) අසම්භාව්‍ය වත්කම් සහ වගකීම්

| | 2017.12.31 දිනට පැවති අසම්භාව්‍ය වත්කම්වල ස්වභාවය | අසම්භාව්‍ය වත්කම හටගත් පාර්ශවය | ඇස්තමේන්තුගත මුදල් ගලාඒම් | මුදල් ලැබීම් මැනීමට නොහැකි නම |
|---|---|---|---|---|
| i. | නොගෙවන ලද කුලී, විදුලිය හා පවිත්‍රතා ගාස්තු අය කරගැනීමට නඩු පැවරීම - වෙන්නායි වෙළඳනඩු පැවරීම - වෙන්නායි වෙළඳ මධ්‍යස්ථානය | පිමා හෝල්ඩින් (පුද්ගලික) සමාගම | 1,284,515.00 | නීති වියදම |
| | | පෙම් නේෂන් (පුද්ගලික) සමාගම | 2,226,596.78 | නීති වියදම |
| | | යුනික් මල්ටි ආටස්ට | 194,142.50 | - |
| | | සාරා ඔස් ලෙදර (පුද්ගලික) සමාගම | 2,125,000.00 | - |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2017.12.31 අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන්**

| | | | | |
|---|---|---|---|---|
| ii. | ණය පැහැරහැරීම් | ඉන්ටර්නැෂනල් පේපර් ප්‍රඩක්ට්ස් | 476,973.00 | - |
| | | වර්ක්ස් ඔෆ් ආට්ස් | 42,000.00 | - |
| | | රාජාස් ජුවලරි | 90,418.00 | - |
| | | ශ්‍රීමක් සී ෆුඩ්ස් | 169,620.00 | - |
| | | සිලෝන් ඕනමන්ටල් සෙරමික්ස් | 299,720.00 | - |
| | | කොකනට් හස්ක් චිප්ස් | 44,800.00 | - |
| | | සමන් ජෙම් ඇන්ඩ් ජුවලර්ස් | 252,912.02 | - |
| | | යුනිසයිකල් මාර්කටින් | 278,455.58 | - |
| | | වර්ල්ඩ් ෆැෂන් | 30,000.00 | - |
| | | යුනික් මල්ටි ආට්ස්ට් | 287,006.54 | - |
| iii. | පසුගෙවුම් ගමන් වියදම් අය කර ගැනීම | එස්. වීරකෝන් මිය | ඇ.එ.ජ. ඩොලර් 1,598.46 | - |
| iv. | බැඳුම්කරය ආපසු ගැනීම | සිරිකුමාර | 104,725.45 | - |
| v. | අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ගෙවන ලද අත්තිකාරම් ගෙවීම් ආපසු ගෙවන නඩුව | සෝලාර් ග්‍රීන් ප්ලාන්ටේෂන්(පුද්ගලික) සමාගම | 1,505,932.00 | - |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ටීසීඑම2/එෆ්/ටීඩීබී/1/17/17 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2018 නොවැම්බර් 30 දින |

සභාපති,

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාව මණ්ඩලයේ සභාපති වෙත 2018 සැප්තැම්බර් 21 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයපථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24

ප්‍රමිතියේ 25 සහ 26 ඡේද අනුව ආශ්‍රිත සමාගම් සමඟ සිදු කරනු ලබන සියළුම ගනුදෙනු විස්තරාත්මකව හෙළිදරව් කළ යුතු වුවත් මණ්ඩලය එහි ආශ්‍රිත සමාගමක් වූ ඩිවලොප්මන්ට් හෝල්ඩින් පුද්ගලික සමාගමට ගෙවූ රු.617,818 ක් වූ ගනුදෙණු මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය සහ ඩිවලොප්මන්ට් හෝල්ඩින් පුද්ගලික සමාගම සමඟ එළඹී බදුකුලී ගිවිසුමට අනුව සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු රු.5,937,500 ක බදු කුලිය හා වාහන නැවැත්වීමේ කුලී රු.120,108 ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) තිස්සමහාරාම අපනයන නිෂ්පාදන ගම්මාන සමාගමට ලබාදී තිබූ රු. 2,493,310 ක් වූ ණය මුදල සඳහා අයවිය යුතු රු. 2,793,599 ක පොලී ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් පුද්ගලික සමාගමක ආයෝජනය කර තිබූ කොටස්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව රු. 3,000,000 ක් වුවද මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශ ලේකම් ඇමතූ සභාපතිගේ අංක ඊඩීබී/ආර්ඩීඩී/ආර්1/එම්අයිඑස්/022 දරන හා 2017 ඔක්තෝබර් 31 දිනැති කපා හැරීමට ඉල්ලුම් කර තිබූ ලිපිය අනුව ආයෝජිත මුදල රු. 2,948,731 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) මණ්ඩලය විසින් පෞද්ගලික සමාගමක ආයෝජිත ප්‍රාග්ධනය ලෙස ලෙජරයේ රු.598,457 ක් දක්වා තිබුණ ද ආයෝජන අඩුකිරීම් වෙන්කිරීමේ ලේඛනයේ එය රු.3,598,457 ක් ලෙස දක්වා තිබීම නිසා රු.3,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

රත්මලාන ගබඩාවට අයත් රු.877,303 ක වටිනාකමින් යුතු බදු කුලී ගිවිසුම් සහ තක්සේරු වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීතිරීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| (i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 4.2.6 ඡේදය | කාර්තුවක් අවසන් වී දින 30 ක් තුළ රේඛීය අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට කාර්තුමය කාර්යසාධන වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) 5.2.5 ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත අයවැය ලේඛනයේ පිටපතක් ඊළඟ වර්ෂය ආරම්භ වීමට දින 15කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) 2016 දෙසැම්බර් 16 දිනැති අංක පීඊඩී 05/2016 චක්‍රලේඛයේ 4.3 වගන්තිය | සාමාන්‍ය පටිපාටියෙන් බැහැරව ප්‍රසාද දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා සමාගම සම්බන්ධයෙන් බැහැරව ගෙවා තිබූ රු.2,560,467ක ප්‍රසාද දීමනා සඳහා එසේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

මණ්ඩලය විසින් තම ප්‍රධාන කාර්යාලය පවත්වා ගැනීම සඳහා භාවිතා කරනු ලබන නවම් මාවතේ මහල් 5 කින් යුතු ගොඩනැගිල්ල සඳහා 2016 මාර්තු 15 දින සිට 2017 මාර්තු 14 දින දක්වා පුද්ගලික සමාගමක් සමඟ බදු කුලී ගිවිසුමකට එළඹ තිබූ අතර 2017 මාර්තු 15 සිට 2017 ඔක්තෝබර් 26 දක්වා ගිවිසුමකින් තොරව රු.37,150,685 ක් කුළී ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.20,282,474 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.45,773,906 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.66,056,380 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රජයේ ප්‍රදාන රු.11,806,660 කින් අඩුවීම මෙන්ම පරිපාලන වියදම් රු.34,209,711 කින් හා අපනයන සංවර්ධන වියදම් රු.19,343,743 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලය පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අඛණ්ඩව ශුද්ධ ලාභයක් ඇතිවී තිබූ අතර එය වාර්ෂිකව උච්චාවචනය වී සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ අලාභයක් වී තිබුණි.කෙසේ වුවද මූල්‍ය ප්‍රථිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමෙදී 2013 වර්ෂයේදී රු.287,157,318 ක් වූ දායකත්වය ඉන්පසු වර්ෂවලදී පිරිහී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී දායකත්වය රු.197,541,947 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සැලසුම් කිරීම් හා ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එක් එක් ක්‍රියාකාරකම් ආරම්භ කරන හා අවසන් කිරීමට අපේක්ෂිත කාල වකවානු සඳහන් ක්‍රියාකාරී සැලැස්මක් හා භෞතික ප්‍රමාණ දක්වා ඇති කාර්යසාධන වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා මණ්ඩලයේ ප්‍රගතිය සංසන්දනාත්මකව පරීක්ෂා කළ නොහැකි විය.

(ආ) අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අනුමත කාර්යය මණ්ඩලය හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර, අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය ඇතුළත් මානව සම්පත් සංවර්ධන සැලැස්ම මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ වැඩසටහන් 12 ක් ක්‍රියාත්මක කර හා සම්පූර්ණ නොකිරීම නිසා රු. 12,460,000 ක් උපයෝජනය නොවී පැවතුණි.

(ඈ) අයවැය ලේඛනයේ සඳහන් ක්‍රියාකාරකම් 10 වෙනුවෙන් රු. 24,400,000 ක් ප්‍රතිපාදනය කර තිබූ නමුත් එය ඉක්මවා රු.13,900,000 ක් වැය කර තිබුණි.

(ඉ) ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබූ participation at ICA congress -2017 සහ Co – organize jewels Talk conference යන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.900,000 ක් වැය කර තිබුණි.

(ඊ) 2016 වර්ෂයේදී සැලසුම් කළ නමුත් ක්‍රියාත්මක කර නොතිබූ රු. 8,900,000 ක් ප්‍රතිපාදිත වැඩසටහන් 11 ක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොමැති අතර සමාලෝචිත වර්ෂයේදී සැලසුම් කළත් ක්‍රියාත්මක නොකළ රු. 7,300,000 ක් වෙන් කළ වැඩසටහන් 09 ක් ඉදිරි වර්ෂයට ගෙන යන බවට කාර්යසාධන වාර්තාවේ සඳහන් කර තිබුණ ද 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඒවා ඇතුළත් කර නොතිබුණි.

(අ) මත්ස්‍ය නිෂ්පාදනය සම්බන්ධ ජාත්‍යන්තර ගැණුම්කරුවන් හඳුනාගැනීමේ අරමුණින් 2017 අප්‍රේල් 25 සිට 27 දක්වා බෙල්ජියම් හිදී පවත්වන ලද SEAFOOD EXPO GLOBAL වෙළඳ ප්‍රදර්ශනය සඳහා අයදුම් කරන ලෙස ඉල්ලමින් පලකර තිබූ දැන්වීමේ මණ්ඩලය විසින් අපනයනකරුවන්ට ලබාදෙන මූල්‍ය අනුග්‍රහය සඳහන් නොවීමෙන් ප්‍රදර්ශනයට අපනයනකරුවන් අයදුම්කිරීම පෙළඹ වීම අඩුවී තිබුණි. තවද මණ්ඩලය විසින් එක් වෙළඳ ප්‍රදර්ශනයක් සඳහා එක් සමාගමකට අවස්ථා 3 කදී පමණක් මූල්‍ය අනුග්‍රහයන් සැපයීම කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී මෙම ප්‍රදර්ශනයට සහභාගී වූ අපනයන සමාගම් 3 කට ඊට පෙර අවස්ථා 5 ක දීද තවත් අපනයන සමාගම් 2 කට අවස්ථා 4 ක දීද මූල්‍ය අනුග්‍රහය සපයා තිබුණි. මෙම ප්‍රදර්ශනයට සහභාගී වී මූල්‍ය අනුග්‍රහය ලබාගෙන තිබුණු එක් සමාගමක් 2015 වර්ෂයෙන් පසු අපනයන සිදුකර නොතිබුණු අතර වෙළඳ ප්‍රදර්ශනයෙන් පසුවද අපනයන සිදුකර නොතිබුණි.

(ඈ) අන්තර්ජාතික වෙළඳපොළෙහි ශ්‍රී ලාංකීය රබර් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට 2017 ජනවාරි 19 දින සිට 21 දින දක්වා කාලය තුළ ඉන්දියාවෙහි පවත්වන ලද INDIA RUBBER EXPO වෙළඳ ප්‍රදර්ශනයට අපනයන කරුවන් තෝරාගැනීමේදී වැඩි අපනයන ආදායම් උපයන මූල්‍ය දුෂ්කරතාවයන් නොමැති සමාගම් සඳහා වැඩි ලකුණු ද අඩු අපනයන ආදායම් උපයන සමාගම් සඳහා අඩු ලකුණුද ලබා දී අපනයන ප්‍රවර්ධනය සඳහා මූල්‍යාධාර දීම සිදු කර තිබීමෙන් මූල්‍ය දුෂ්කරතා පවතින අපනයන කරුවන් නගා සිටුවීමේ හා දිරිදීමේ කාර්යය නිසියාකාරව සිදුකර නොතිබුණි.මෙම වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වූ අපනයනකරුවන් 6 දෙනාගෙන් අපනයනකරුවන් 3 දෙනෙකුම එකම සමූහයකට අයත් අපනයකරුවන් වූ අතර එම සමූහය වෙනුවෙන් මණ්ඩලය විසින් රු. 527,100 ක මූල්‍ය අනුග්‍රහයක් ලබා දී තිබුණි. මේ නිසා අනෙකුත් අපනයනකරුවන්ට ඇති අවස්ථා අහිමිකර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල පෞද්ගලික සමාගම් 35 ක සාමාන්‍ය කොටස් වල ආයෝජනය රු. 58,312,484 ක් හා සමාගම් 29 ක වරණීය කොටස් වල කළ ආයෝජනය රු.105,066,208 ක් ලෙස දක්වා තිබුණි. මෙම ආයෝජන වලින් එකතුව රු. 17,315,000 ක් ආයෝජනය කර තිබූ සමාගම් 3 ක් 2002, 2007 සහ 2009 යන වර්ෂ වලදී විසුරුවා හැර තිබූ අතර ඇවරකරු විසින් කොටස් වල ආයෝජිත මුදල් ආපසු ගෙවීමට වත්කම් නොමැති බව

දක්වා තිබුණි. තවද සමාගම් ලියාපදිංචි නාම ලේඛනයෙන් කපා හැර තිබූ සමාගම් 25 ක ආයෝජනය කර තිබූ රු. 46,323,648 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. මණ්ඩලය විසින් ආයෝජන කාලානුරූපව සමාලෝචනය කර ඇතිවිය හැකි ප්‍රාග්ධන අලාභ වලක්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කෘෂි අපනයන කලාප තුළ අපනයන අභිමුඛ කෘෂි ව්‍යාපෘති 50 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2009 වර්ෂයේදී සපයා දී තිබූ රු. මිලියන 500 ව්‍යාපෘතිය යටතේ හම්බන්තොට වීරවිල අක්කර 18 ක භූමි ප්‍රදේශයක එළවළු හා පළතුරු වගාව සඳහා පෞද්ගලික සමාගමක් සමඟ සමඟ එක්ව ආරම්භ කළ කෘෂි ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) සමාගම වෙත 1998 ජනවාරි 01 දින සිට 2002 දෙසැම්බර් 24 දින දක්වා මණ්ඩලය විසින් රු. 2,493,310 ක මුදලක් ලබා දී තිබූ නමුත් 2018 ජූලි වන විටත් එම මුදල හා ඊට අදාළ පොළී අයකර ගෙන නොතිබූ අතර මණ්ඩලයේ සහ එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල එය ලැබිය යුතු/ගෙවිය යුතු ලෙස සටහන් කර නොතිබුණි.

(ii) 2009 නොවැම්බර් 27 දින දෙපාර්ශවය අතර එළඹී ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුදල රු. 8,000,000 ක් වූ අතර වසර 10 කින් අදියර 3 ක් යටතේ නිම කළ යුතු විය. එසේ වුවද පළමු අදියර සඳහා ප්‍රතිපාදිත මුදල රු. 3,857,360 ක් තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් වෙත 2009 නොවැම්බර් 26 දින නිකුත් කර තිබුණද සමාගම විසින් ඉන් රු.2,043,890 ක මුදලක් මාස 9 ක කාලයක්, වැය නොකර නිෂ්ක්‍රීයව තබාගෙන තිබුණි.

(iii) මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ කෘෂි අපනයන කලාපයේ කුරුඳු, ඉඟුරු හා වැනිලා ආදී සුළු අපනයන භෝග ඉහළ ප්‍රමිතීන් යටතේ වැඩිදියුණු කර අපනයන වෙළඳාම කරා යොමු කිරීම වුවද අරමුණු වලට පටහැනි ලෙස රු. 1,400,000 ක් වැය කර අඹ පැල 2000 ක් මිළ දී ගෙන අක්කර 15 ක අඹ පැල 500 ක් පමණක් වගාකර ඉතිරි පැල 1,500 ගොවීන්ට බෙදා දී තිබුණි. තවද රු. 52,000 කට මිළදී ගෙන තිබූ කෙසෙල් පැල 1000 ක් ද නියඟය නිසා විනාශ වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iv) අපනයන අභිමුඛ කෘෂි ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කළ මෙම ව්‍යාපෘතියෙන් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ඉපයූ රු. 7,793,864 ක මුළු ආදායමෙන් අපනයන ආදායම රු.2,338,160 ක් පමණි. තවද 2016 හා 2017 වර්ෂ

වලදී අපනයනයන් සිදු කර නොතිබීමත්, අඹ පැල ලබාගත් ප්‍රතිලාභීන්ට දේශීය හා විදේශ වෙළඳපොළ අවස්ථා ලබාගැනීමට මණ්ඩලය සහය නොවීමත් නිසා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(v) මෙම කෘෂි අපනයන කලාපය තුළ පළාත් මට්ටමින් කෘෂි නිෂ්පාදන එකතු කිරීම හා ඒවායේ අපනයන මට්ටම වර්ධනය කිරීමේ අරමුණින් සැකසීම හා ඇසුරුම් කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීමට හා ඊට අවශ්‍ය ගෘහ භාණ්ඩ මිළදී ගැනීමට රු. 24,120,000 ක් මණ්ඩලය විසින් අනුමතර කර තිබූ අතර 2015 ජූලි 28 දින වන විට රු. 18,590,296 ක් වැය කර ඉදිකිරීම් සිදු කර තිබුණ ද 2018 වර්ෂය වන විටත් එම මධ්‍යස්ථානය තුළ කිසිඳු ඇසුරුම් හෝ සැකසුම් කටයුත්තක් සිදු කර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයකට විහිදෙන අපනයන අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා සහයෝගිතාවය දැක්වීමේ ව්‍යාපෘතිය පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ව්‍යාපෘතියට අදාළ අයදුම්පත් ඇගයීම 5 දෙනෙකුගෙන් යුතු ඇගයීම් කමිටුවකින් සිදුකළ යුතු වුවත් අවස්ථා 5 කදී අනුමත ප්‍රමාණයට වඩා අඩු සාමාජිකයන් පිරිසක් ඇගයීම් කටයුතු සිදු කර තිබුණි.

(ii) මාර්ගෝපදේශයට අනුව අයදුම්කරුවන් විසින් වැඩසටහනට අදාළ වියදම් ප්‍රතිපූර්ණයට පෙර යෝජිත සංවර්ධන වැඩසටහන මණ්ඩලයේ අනුමැතියට භාජනය කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii) මණ්ඩලය විසින් වැඩසටහන් වලට අදාළ අපනයනකරුවන්ගේ වියදම් ප්‍රතිපූර්ණය කිරීමෙන් පසුව ඔවුන් විසින් සපුරාලිය යුතු කොන්දේසි හෝ අත්කරගත යුතු යැයි අපේක්ෂා කරන ප්‍රගතිය සම්බන්ධයෙන් ගිවිසුම්වලට එළඹ නොතිබුණු අතර ප්‍රගතිය ඇගයීම නිසි පරිදි සිදුකර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළ දී පවත්වන ලද ප්‍රදර්ශන 3 ක් සඳහා අදාළ අපනයන කරුවන්ගෙන් අයකළ යුතු මුදලට වඩා එකතුව රු.2,676,342 ක් වැඩිපුර අයකර තිබුණු අතර එම මුදල් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ආකාරය පිළිබඳ තීරණයක් ගෙන නොතිබුණි.

**4.4 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හා නියෝජ්‍ය අධ්‍යක්ෂක වරයකු රේඛීය අමාත්‍යංශය වෙත පිළිවෙලින් 2017 මාර්තු 13 හා 2017 අගෝස්තු 30 දින වලදී මුදාහැර ඇති අතර එම නිලධාරීන්ගේ වැටුප් හා දීමනා වෙනුවෙන් රු.817,898 ක මුදලක් 2017 දෙසැම්බර් 31 වන විට මණ්ඩලය විසින් දරා තිබුණි.

(ආ) මණ්ඩලයට අයත් ඩබල් කැබ් රථයක් 2015 ඔක්තෝබර් 30 දින සිට 2017 දෙසැම්බර් 22 දින දක්වා රේඛීය අමාත්‍යංශයට මුදාහැර තිබූ අතර එම කාලපරිච්ඡේදය වෙනුවෙන් මණ්ඩලය විසින් රු. 128,515 ක මුදලක් අලුත්වැඩියා හා නඩත්තු වෙනුවෙන් වැය කර තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

2017 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්යමණ්ඩලය 282 ක් වුවත් සත්‍ය කාර්යමණ්ඩලය 249 ක් වුයෙන් තනතුරු 36 ක් පුරප්පාඩුව පැවතුණි. මෙම පුරප්පාඩු නිසා මණ්ඩලයේ ප්‍රධාන අරමුණ ඉටුවන ආකාරයට අදාළවන තනතුරු හඳුනාගෙන එම තනතුරු පුරප්පාඩු පිරවීමට ක්‍රියාකර නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත මණ්ඩලය විසින් සිය විෂය පථයට අනුව ළඟාකර ගත යුතු අරමුණු වශයෙන් තිරසර සංවර්ධන අරමුණු වන බලය පැවරීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟාකර ගැනීම, තිරසාර කාර්මීකරණය හා නව්‍යතා සඳහා දිරිගැන්වීම හඳුනාගෙන තිබුණ ද, එහි විෂය පථයට ගැනෙන අනෙකුත් අරමුණු වන තිරසාර මූල්‍ය සංවර්ධන සඳහා ගෝලීය සබඳතාව ශක්තිමත්ව ක්‍රියාවට නැංවීමෙහි අරමුණෙහි අඩංගු (17 වන අරමුණ) අපනයන සංවර්ධනය හා විදේශ වෙළඳාම නැංවීමේ ඉලක්ක හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ හෙයින් ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබීම නිසා මණ්ඩලයේ වාර්ෂික සැලැස්මට එම කාර්යයන් ඇතුළත් කර අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයට අනුමත තනතුරු 5ක් පැවති අතර සමාලෝචිත වර්ෂය තුළ වාර්තා 15 ක් නිකුත් කර තිබුණි. ඉන් වාර්තා 2 ක් සඳහා කළමනාකාරීත්ව විසින් පිළිතුරු ලබාදී නොතිබුණි. තවද අපනයන ප්‍රවර්ධන නිලධාරී ලෙස බඳවා ගන්නා ලද නිලධාරීනියක් 2017 ජනවාරි 02 දින සිට අභ්‍යන්තර විගණන නිලධාරී ලෙස අනුයුක්ත කර තිබුණි.

### 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පාලනය

#### 6.2.1 ප්‍රසම්පාදනයන්

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.19(ආ) ඡේදය අනුව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවද මණ්ඩලය විසින් 2017 වර්ෂය සඳහා පමණක් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2(ආ) ඡේදය පරිදි එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි ආරම්භක අවස්ථාවේ සිට අවසන් කරන තුරු පියවරයන් ක්‍රමානුකූලව විස්තර කෙරෙන ප්‍රසම්පාදන කාල සටහනක් මණ්ඩලය විසින් පිළියෙල කර නොතිබුණි.

(ඇ) Seafood Expo Global වෙළඳ ප්‍රදර්ශනයේ වෙළඳ කුටි ඉදිකිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතන 7 අතුරින් අඩුම මිලගණන ඉදිරිපත් කරන ලද ආයතනය වෙළඳ කුටියේ නිර්මාණාත්මක හැඩතළවල පැවති අඩුපාඩු සාකච්ඡා මට්ටමින් විසඳාගැනීමට හැකියාව තිබියදී එම මිල ප්‍රතික්ෂේප කර අවම මිලට වඩා යූරෝ 10,516ක් වැඩි අගයකට මිල ගණන් ඉදිරිපත් කළ දෙවන මිල ඉදිරිපත් කළ ආයතනය තෝරාගෙන තිබුණි.

### 6.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ සංශෝධිත අයවැය හා සත්‍ය වියදම සංසන්දනයේදී අයිතම 3 ක සියයට 47 සිට 3400 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

පසුගිය විගණන වාර්තාවලින් පෙන්වා දී ඇති නමුත්, ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු විගණන ඡේද පහත දැක්වේ.

| වර්ෂය | ඡේද අංකය | විගණන ඡේදය |
|---|---|---|
| 2016 | 2.4 (ආ) | ගුවන් මගින් කරනු ලබන සියලුම ගමන් පිරිමැසුම් පන්තිය උපයෝගී කරගෙන යායුතු වුවත් මණ්ඩලයේ සභාපතිනිය හා විධායක අධ්‍යක්ෂ විසින් විදේශ සංචාර සඳහා ව්‍යාපාරික පන්තියේ ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම වෙනුවෙන් රු.1,886,350 ක් වැය කර තිබුණි. |
| | 2.4 (ඇ) | 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීරී 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව මණ්ඩලයේ අවුරුදු 25 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින්ට රන් පවුම් ලබා දීම සඳහා 2014 සිට 2016 වර්ෂය දක්වා රු.478,002 ක් වැය කර තිබුණද, සිය සේවකයින්ට ප්‍රතිලාභ ගෙවීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන භාවිතා කිරීමේදී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| | 4.6 (ඈ) (ii) | සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2016 අගෝස්තු 21 දින පැවැත් වූ විභාගයේ ප්‍රතිඵල මත බාහිර අයදුම්කරුවන් 5 ක් හා අභ්‍යන්තර අයදුම්කරුවන් 4 ක් බඳවාගෙන තිබුණි. මෙම විභාගයේ ඉංග්‍රීසි විෂයය සඳහා ලබා දුන් කාලය ප්‍රමාණවත් නොවන බව සඳහන් කරමින් අභ්‍යන්තර අයදුම්කරුවන් කරන ලද ඉල්ලීමකට අනුව ඉංග්‍රීසි විෂයයට පමණක් නැවත විභාගය පවත්වා තිබුණි. |

| | | |
|---|---|---|
| | 2.4 (අ) | සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකත්වය ගණනය කිරීමේදී විශේෂ දීමනා, වෘත්තීය දීමනා ,අන්තර් දීමනා හා අනුමත නොවූ විශේෂ ජීවන වියදම් දීමනා ඇතුළත් කිරීම හා ජීවන වියදම් දීමනාව ඇතුළත් නොකිරීම මත විගණනයට භාජනය වූ 2012 සිට 2015 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලට රු.5,508,199 ක් හා සේවක භාරකාර අරමුදලට රු.659,375 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |
| | 4.2 (අ) | කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා වැඩසටහන් සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීමේදී නිසි තොරතුරු ඇතුළත් නොකිරීම හා කාලානුරූපව කටයුතු නොකිරීම නිසා අවස්ථා දෙකකදී එකම කරුණ සඳහා පුවත්පත් දැන්වීම් 2 ක් පල කර තිබූ අතර,එහිදී පළමු පුවත්පත් දැන්වීම සඳහා වැය කළ රු.698,140 ක් අනාර්ථික වියදමක් වී තිබුණි. |
| | 4.3 | කුරුඳු නිෂ්පාදකයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටු වීම සඳහා පෞද්ගලික ආයතනයකට රු.26,373,010 ක් ගෙවා තිබුණි. මෙම මධ්‍යස්ථානය තුළින් අපනයන ප්‍රමාණයේ වර්ධනයට දායකත්වයක් 2017 ජූනි 28 දින වනවිටත් ලැබී නොමැති නිසා මෙම පුහුණු මධ්‍යස්ථානයට දරන ලද වියදම ඵලදායී වී නොතිබුණි. |
| 2015 | 2.3 (අ) | ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන අරමුදලින් ලබා දුන් රු.5,000,000 ක් වූ ණය මුදලින් රු.2,891,748 ක් නිරවුල් කර නොතිබුණි. |
| | 2.4(අ) | 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 23(I) වගන්තියට පටහැනිව පත් කර තිබූ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ සඳහා 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වැටුප් හා දීමනා ලෙස රු.4,076,773 ක්, රාජකාරි හා පෞද්ගලික ගමන් සඳහා ලබාදී තිබූ වාහනයේ කුලී ලෙස රු.6,270,670 ක් හා විදේශ ගමන් සඳහා දීමනා හා ගමන් ගාස්තු ලෙස රු.2,122,770 ක් වශයෙන් එකතුව රු.12,470,213 ක් විධිමත් අධිකාර බලයකින් තොරව ගෙවා තිබුණි. |

2.5(අ) 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 2 (1) අනුව ජනාධිපතිවරයාගේ සභාපතිත්වයෙන් හා වෙළඳ නැව් කටයුතු,කර්මාන්ත,කෘෂිකර්මාන්ත,ධීවර,මුදල්,විදේශ කටයුතු, ක්‍රම සම්පාදන සහ ග්‍රාමීය කර්මාන්ත යන විෂයන් භාර අමාත්‍යවරයන්ගෙන් සමන්විත ජාතික සංවර්ධන සභාවක් පිහිටුවිය යුතු අතර
පනතේ 13 (1), (2) වගන්ති අනුව මන්ඩලයේ බලතල,කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි හා ඉටුකිරීමෙහි ලා මණ්ඩලයට දරන්නට වන යම් වියදමක් පියවීම සඳහා අපනයන සංවර්ධන අරමුදලක් පිහිටුවිය යුතු ය.

1992 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ වර්ෂ 23ක කාලපරිච්ඡේදය තුළදී අපනයන සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික සංවර්ධන සභාව රැස්වී නොතිබුණ අතර අපනයන සංවර්ධන අරමුදල පිහිටුවා නොතිබුණි.

2.5 (එ) (i) 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව පසුගිය වසර 4 ක් තුළ වෘත්තීය දීමනාව රු.2,182,894 ක්, විශේෂ ජීවන වියදම් දීමනාව රු.18,284,887 ක් හා ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා රු.12,458,798 ක් වැය කර තිබුණි.

4.2(ආ) (iv) අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව රු.5,040,000 ක මුදලක් එක්ස්පෝ ශ්‍රී ලංකා දිනය වෙනුවෙන් වෙන්කර තිබියදීත් මණ්ඩලයේ සභාපති සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් එම දිනය වෙනුවෙන් සහභාගී වීමට රු.1,079,688 ක් වැය කර තිබුණි.

4.2(ආ) (vi) එක්ස්පෝ ප්‍රදර්ශනයට පත් කර තිබූ මණ්ඩලයේ නිලධාරීන්ට 2015 මැයි 15 දිනැති අංක MF01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 04(ඩී) වගන්තියට පටහැනිව විදේශ ගමන් දීමනා සඳහා රු.3,770,640 ක් ගෙවා තිබුණි.

| | | |
|---|---|---|
| | 4.2(ඇ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 25 වගන්තිය, 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව අනුමැතියකින් තොරව සේවක ණය අරමුදලක් පිහිටුවීමට හා ඊට මාසිකව සියයට 7.2 ක පොලියක් බැර කිරීමට 2015 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රදාන රු.2,567,531 ක් භාවිතා කර තිබුණි. |
| | 4.6 | 2015 වර්ෂයේ විගණන වාර්තාවෙන් හඳුනාගන්නා ලද පාඩු රු.1,918,314 ක් පෙන්වා දුන්නද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| 2014 | 4.5 (ඇ) | 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ බලතල හා කර්තව්‍යයන්ට පටහැනිව 2014 වර්ෂයේදී රු.2,520,848 ක වියදම් දරා තිබුණි. |
| | 2.5 (අ) (ii) | 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 12(ට) වගන්තිය අනුව මණ්ඩලය විසින් 1988 වර්ෂයේ සිට පෞද්ගලික සමාගම්වල කර තිබුණු රු.929,548,150 ක් වූ ආයෝජන සඳහා මුදල් අමාත්‍යවරයාගෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| | 4.9 | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයට අයත් වාහන 5 ක් සහ නිලධාරීන් 4 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ සේවයට යොදවා 2014 වර්ෂයේදී වාහන නඩත්තු වියදම්, කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ලෙස රු.2,824,256 ක් මණ්ඩලය විසින් දරා තිබුණි. |
| 2013 | 2.2.5 (ආ) | ජාතික සවිය වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගෙවිය යුතු ලෙස දක්වා තිබූ රු.1,009,740 ක් එම කාර්යාලයෙන් තහවුරු කර ගැනීමකින් තොරව සහ විධිමත් අනුමැතියකින් තොරව ආදායමට බැර කර තිබුණි. |
| | 4.2 (ඊ) | ඉන්දියාවේ චෙන්නායි නුවර 2004 සිට 2009 කාලපරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබූ ශ්‍රී ලංකා වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳසැල් 5 කින් අය විය යුතු හිඟ කුළී හා විදුලි ගාස්තු රු.7,049,858 කින් රු.3,084,693 ක මුදලක් 2018 සැප්තැම්බර් 15 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. |

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | (i) මුදල් ආයෝජනය සම්බන්ධයෙන් නිසි අනුමැතිය ලබා නොගැනීම හා පසු විපරම් නොකිරීම.<br>(ii) අපනයන සමාගම් සමඟ ඇති කරගත් ගිවිසුම් පරිදි ණය හා පොලිය අය කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) විශේෂ ව්‍යාපෘති පාලනය | මණ්ඩලය විසින් ව්‍යාපෘති ආරම්භ කර ඉලක්කගත අරමුණු සපුරා ගැනීමකින් තොරව අතහැර දැමීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවාගැනීමේ පටිපාටිය අනුව සේවයට බැඳී වසර 03 ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් විභාග නොපැවැත්වීම හා නියමිත විෂය කට්ටලය වෙනුවට එක් විෂයක් පමණක් විභාගයට ඇතුළත් කිරීම |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති